SLITA

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

இலங்கை புடைவை மற்றும் ஆடை நிறுவகம

SRI LANKA INSTITUTE OF TEXTILE & APPAREL

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

2020



State Ministry of Batik, Handloom Textile & Local Apparel Products

Kandawala Estate, No. 2, Gen. Sir John Kothalawala Rd, Ratmalana.

Phone: +94 11 26 32 406, +94 11 26 36 917 Fax: +94 11 26 36 337, + 94 11 26 22 897,

E-mail: train@textile-clothing.lk Web: www.slita.lk




අපගේ
දැක්ම

පේෂකර්ම, ඇඟලුම් හා සම් නිෂ්පාදන ආශ්‍රිත කාර්මික ක්ෂේත්‍රයන්හි කාර්ය මණ්ඩල ප්‍රවීණතාවය වැඩිදියුණු කිරීම හා උපදේශන සේවා සැපයීම, පරීක්ෂණ, පර්යේෂණ සහ සංවර්ධන සහ නවෝත්පාදන සිදුකිරීම සඳහා ගෝලීය වශයෙන් පිළිගැනීමට ලක්වූ ආයතනයක් බවට පත්වීම”

අපගේ
මෙහෙවර

“තිරසාර සංවර්ධනය අපේක්ෂාවෙන් ඵලදායීතාව, භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය හා රෙදිපිළි, සම් භාණ්ඩ නිෂ්පාදන, ඇඟලුම් ආශ්‍රිත කර්මාන්ත වල සාමූහික අගය ඉහළ නැංවීම සඳහා ප්‍රවීණතාවයෙන් හෙබි, මනා පුහුණුවක් සහිත මානව ප්‍රාග්ධනය, විශ්වසනීය විශේෂඥ දැනුම හා නව්‍ය විසඳුම් ඉදිරිපත් කිරීම”

අපගේ සේවාවන්



ආයතනික තොරතුරු

ආයතනයේ නම	:	ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය
ලිපිනය	:	කඳවල වත්ත අංක 02, ජනරාල් සර් ජෝන් කොතලාවල මාවත, රත්මලාන
ලියාපදිංචි කිරීම	:	වර්ෂ 2009 අංක 12 දරණ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් පනත
නෛතික ස්වරූපය	:	ව්‍යවස්ථාපිත මණ්ඩලය
රේඛීය අමාත්‍යාංශය	:	බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය
අධ්‍යක්ෂ මණ්ඩලය	:	ආර්. සුනේත්‍රා ගුණවර්ධන මිය (සභාපතිනිය)
		යොහාන් ලෝරන්ස් මයා
		කේ. එච්. බන්දුල ප්‍රනාන්දු මයා
		මහාචාර්ය යූ. ජී. එස්. විජයපාල මිය
		ෆීලික්ස් ප්‍රනාන්දු මයා
		සුරේෂ් ඉන්දික මයා
		ඩී. ඒ. එස්. දහනායක මයා
		අංජලී වීරසිංහ මිය
		චන්දන පුෂ්පකුමාර මයා
විගණක	:	විගණකාධිපති දෙපාර්තමේන්තුව
දුරකථන අංක	:	2632406 / 2636336
ෆැක්ස් අංක	:	2636337
විද්‍යුත් ලිපිනය	:	director@textil-clothing.lk, info@slita.lk
වෙබ් අඩවිය	:	www.slita.lk

පටුන

	පිටුව
සභාපතිතුමියගේ පණිවිඩය	1
අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය	2
අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය	3
ආයතනය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව	4-6
කාර්යසාධනය පිළිබඳ සුවිශේෂී අවස්ථා	7-8
ගිණුම් ප්‍රතිපත්ති	9-11
පොදු අනාවරණය කිරීම	12-13
මූල්‍යය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	14
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය	15
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය	16
ශුද්ධ වත්කම්/ස්කන්ධවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය	17
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	18-34
කාර්යසාධන දර්ශක	35-36
මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව	37-41
2020 වර්ෂයේ ක්‍රියාකාරකම්	42-47
2021 වර්ෂයේ ඉදිරි සැලසුම්	48
විගණකාධිපති වාර්තාව	49-57

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ සභාපතිනියගේ පණිවිඩය

ස්වයංමූල්‍යනය ආයතනයක් වශයෙන් සාර්ථකත්වයක් ලද 2020 වර්ෂය අවසන් කළ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කිරීමට අවස්ථාව ලැබීම ගැන එහි සභාපතිනිය වශයෙන් මම සතුටට පත් වෙමි. වෙනත් සේවා අතර පුද්ගලයන් සමඟ කටයුතු කිරීමේ දක්ෂතා සහිත අය බිහි කිරීමෙහිලා පසුගිය 30 අවුරුදු කාලය පුරා ශ්‍රී ලංකාව තුළ මෙම ආයතනය පුරෝගාමී පේෂකර්ම හා ඇඟලුම් පුහුණු ආයතනය වී තිබේ. පැන නගින වෙළඳපොළවල් තුළ පවත්නා ගෝලීය ආර්ථික තරගකාරිත්වයට මුහුණ දීමට හැකිවන ආකාරයේ පූර්ව සුදුසුකම් ඇති නායකයන් බවට ඔවුන් පත්වී සිටිති. මෙම කර්මාන්තය තුළ පැන නගින අභියෝගයන් පිළිබඳ ඕනෑම අවස්ථාවකට මුහුණ දිය හැකි ආකාරයේ යෝග්‍ය ඥාන සම්භාරයකින් ඔවුන් සන්නද්ධවී සිටිති.

මෙම කර්මාන්තයේ වෙළෙඳපොළ අවශ්‍යතාවලට යෝග්‍ය වන ආකාරයෙන් සැලසුම් කළ ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලා මගින් මේ රටේ යෞවනයන්ට ලබා දෙන අධ්‍යාපනික අවස්ථා පුළුල් කර තිබීමද ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ ප්‍රශංසනීය ප්‍රයත්නයකි. මෙම කර්මාන්තයේ අභිලාෂයන්ට ඉඳුරාම යෝග්‍ය වන අන්දමින් නිශ්චිත වශයෙන්ම වැඩි දියුණු වූ හා උත්ශ්‍රේණිගත අනාගත වෘත්තිකයන් මෙම අධ්‍යයන පාඨමාලා ක්‍රියාවලිය මගින් බිහිවනු නියතය. මෙම කර්මාන්තයේ නියුක්ත පුද්ගලයන්ගේ දීර්ඝකාලීන ඉල්ලීමක් වන, සුවිශාල බිලියන ගණනින් යුත් ඩොලර් වෙළෙඳ පොළට යෝග්‍ය වන ආකාරයෙන් උපාධිධාරීන් බිහි කිරීමට දේශීය වශයෙන් සකස් කළ උපාධි පාඨමාලා ඉදිරිපත් කිරීමට ද සමස්තයක් වශයෙන් රටට බොහෝ අවස්ථා විවෘත වන ආකාරයේ සැලසුම් සකස් වෙමින් පවතී.

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය පුහුණු, තාක්ෂණික හා උපදේශක සේවා ලබා දීමට බැඳී සිටින අතර ආයතනයේ කාර්ය භාරය දකුණු ආසියානු රටවලටද විහිදී යන පරිදි දේශීය සීමා ව්‍යාප්ත කර ලීමටද දැන් සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී. මීට අතිරේක වශයෙන්, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇගලුම් ආයතනය පූර්වගාමී පුහුණු ආයතනයක් වශයෙන් කීර්තියක් ලබා ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය ශිෂ්‍යයන් ද එම ආයතනයට පැමිණෙති. ශ්‍රී ලංකා පෙප්ෂකර්ම හා ඇගලුම් ආයතනයට සෑම වර්ෂයකදීම අග්නිදිග ආසියානු රටවල ශිෂ්‍යයන් කීපදෙනෙක් පැමිණෙති. ඔවුහු ඩිප්ලෝමා උපාධි ලබා ගැනීමෙන් පසු, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇගලුම් ආයතනය පිළිබඳව කීර්තිමත් පණිවිඩය අපට අභිමානයක් වන පරිදි ජාත්‍යන්තර අධ්‍යාපන ක්ෂේත්‍රයට ගෙන ගොස් මෙම පාඨමාලාවල අගය වැඩි කිරීමට උත්සාහ ගන්නා තත්ත්වයක් නිරීක්ෂණය වේ. ගෝලීය කර්මාන්තයක් වශයෙන් වර්ධනය වී ඇති පේෂකර්මාන්ත හා ඇගලුම් කර්මාන්තය අනේකවිධ නිෂ්පාදන ඔස්සේ වේගයෙන් වෙනස් වෙමින් පවතින අතර පාරිභෝගිකයාට තෝරා ගැනීම සඳහා පරාමිතීන් රාශියක් වර්ධනය කර තිබෙන අතර පාරිභෝගිකයන්ගේ අභිලාශයන් මෙම වෙළඳපොළේ ශක්තිමත් හා තීරණාත්මක සාධකයක් වී තිබේ. මේ සංසිද්ධියත් සමඟම නිෂ්පාදකයන් ඔවුන්ගේ ක්‍රියාමාර්ග වෙනස්කර තිබෙන අතර වෙළඳපළ තුළ ඒ සම්බන්ධයෙන් තියුණු තරඟකාරිත්වයක් පවතී. ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇගලුම් ආයතනයට ද එය එසේම බල පැවැත්වේ. එසේ වුවද, ගෝලීය තරගකාරිත්වට මුහුණුදීමට හැකිවන පරිදි මෙම කර්මාන්තයෙන් ඉදිරිපත්වී ඇති අභියෝගයන්ට ඵලදායී ලෙස මුහුණදීමට ආයතනය සූදානම්ව සිටී.

තවද, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය දියුණු වෙමින් පවතින කර්මාන්තයක් තුළ ස්වකීය වෘත්තීය වැඩිදියුණුව පිළිබඳ බලවත් ආශාවක් දක්වන යෞවනයන්ට සහ අනාගත බලාපොරොත්තු සහිත පුද්ගලයන්ට මෙම කර්මාන්තය තුළ අනාගත නායකයන් වීමේ අවස්ථා රාශියක් සලසා දෙයි. රටට බෙහෙවින් අවශ්‍යවන විදේශ විනිමය ඉපයීමට වේගයෙන් දියුණු වන මෙම කර්මාන්තය හරහා මේ රටේ ජාතික ආර්ථිකයටදායකවීමටද අවසානයේදී, ඔවුන් සමත් වනු ඇත.එහෙයින් මෙරටට අභිමානයක් ගෙන එන පරිදි ආර්ථිකය දියුණු තත්ත්වයට පත් කිරීමට ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය අභිමානවත් පාර්ශවකරුවකු වනු ඇත.

මෙරටේ ජාතික ආර්ථිකයට ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය දක්වන දායකත්වය මම සැබෑ වශයෙන්ම අගය කරන අතර අනාගත කාර්යයන්හි සාර්ථකත්වය සඳහා මෙම ආයතනය හා එහි කාර්ය මණ්ඩලයේ ද දායකත්වය පිළිබඳව ඔවුන්ට ස්තුතිවන්ත වෙමි.

ආර්. සුනේත්‍රා ගුණවර්ධන
සභාපතිනිය- ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය
බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය.

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය කරා යොමු කිරීමට අවස්ථාවක් ලැබීම අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් මා ලද වරප්‍රසාදයක් වශයෙන් මම සලකමි. පේෂකර්ම හා ඇඟලුම් අංශය ආශ්‍රිත වැදගත්ම ආයතනය වශයෙන් ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය එහි ප්‍රධානතම කාර්යයන් වශයෙන් පරීක්ෂා කිරීම් සහ උපදේශක සේවා පිරිනමන අතර එම අංශයේ ප්‍රතිලාභ ප්‍රදර්ශනය කිරීම සඳහා මෙතෙක් ප්‍රයෝජනයට ගෙන නැති අවස්ථා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම අරමුණ පෙරදැරිකරගෙන කර්මාන්ත අංශයෙහි විශාල ඉල්ලුමක් ඇති විවිධ කාර්ය පථයන්හි, පාසල් හැරගිය අය සහ කර්මාන්ත ලැදි වෙනත් පුද්ගලයන් යන දෙකොටසම පුහුණු කිරීමට පෙරමුණ ගෙන සිටියි. රෙදිපිළි, ඇඟලුම් සහ හම් කර්මාන්ත සහ පාවන් ආදී විවිධ කාර්යයන්හි විශේෂ දක්ෂතා පුහුණුව මගින් ලබා ඇති අය සඳහා රැකියා සැපයීමට විශාල ඉල්ලුමක් පවතින අතර එබඳු අය ඵලදායී ලෙස සේවයේ නියුක්ත කර ඇති බව මෙහිලා සඳහන් කරමි.

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය එම කර්මාන්තයේ චිර පැවැත්ම සඳහා අසමසම සේවා පිරිනමන අතර රසායනාගාරය මගින් පිරිනමන විශිෂ්ඨ විද්‍යානුකූල දැනුම එහි වැදගත් සේවාවලින් එකකි. ශ්‍රී ලංකාව තුළ උසස් උපකරණවලින් සමන්විත එම ක්ෂේත්‍රයේ විශිෂ්ටතම මධ්‍යස්ථානය වන මෙම රසායනාගාරය ISO සහතික කිරීම් සඳහා පිළිගත් ආයතනයක් වන අතර මෙම කර්මාන්තය සඳහා අවශ්‍ය කරන විවිධාකාර පර්යේෂණ මෙම ආයතනයෙන් ඉටු වේ. මෙම රසායනාගාරයේ දැනට පවතින පහසුකම්වලට අමතරව අනෙකුත් කර්මාන්ත අංශවලට ද අවශ්‍ය කරන පර්යේෂණ ඉටුකරදීම සඳහා ආයතනය විශාල වශයෙන් ව්‍යාප්ත කරලීමට මනාව සකස් කළ සැලසුම් ක්‍රියාත්මක කිරීමට නියමිතයි. වැදගත් පුහුණු පාඨමාලාවන්වලට අමතරව මෙම කර්මාන්තය තුළ වැදගත් අවශ්‍යතා ඉලක්ක කරගත් විශේෂ ක්ෂේත්‍ර කිහිපයක, ආයතනය විසින්ම පිළියෙල කරනු ලබන උපාධි පාඨමාලා ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය සැලසුම් කරමින් සිටියි. තවද, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපළතුල තරඟකාරී ලෙස ක්‍රියා කිරීමට ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍යතා පැන නැඟී ඇති කර්මාන්ත ශාලා සඳහා විශේෂිත පුහුණු පාඨමාලා පිරිනමනු ලැබේ. මේ හැරුණු විට විශේෂයෙන් හදුනාගත් දිස්ත්‍රික්කවල ප්‍රජාවන් සඳහා දැනුම ලබාදීම මගින් තිරසාර ජීවනෝපායන් ඔස්සේ ස්වකීය ජීවන තත්ත්වය වැඩිදියුණු කර ගැනීමට එම ප්‍රජාවට හැකිවන පරිදි ග්‍රාමීය පදනම සහිත කර්මාන්ත සඳහා ද පුහුණු පාඨමාලා ඉදිරිපත් කිරීම මෙම සංවිධානයේ සේවා අතර අග්‍රස්ථානය ගනී.

සංවර්ධන මාර්ගය ඔස්සේ අප පිය නගන විට, අප ආයතනය වැඩි දියුණු කිරීම සඳහාත් ආසියානු ප්‍රාන්තයේ මෙතෙක් නිරාවරණය කරගෙන නැති වෙළඳපොල අවස්ථා ලබා ගනිමින් අයතන කටයුතු මෙරටේ ක්ෂිතිජයන් ඉක්මවා ව්‍යාප්ත කිරීමට ද ව්‍යාපාර අවස්ථා රාශියක් ඉස්මතු වී ඇති බව ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් (SLITA) ආයතනයට නිරීක්ෂණය වේ. මෙම ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු මෙහෙයවීමෙන් සැලකිය යුතු සජීවී මූල්‍ය තත්ත්වයක් 2020 වර්ෂය තුළ ලබා ගැනීමට හැකිවන පරිදි කළමනාකාරිත්වයට, ස්වකීය අප්‍රතිහත සහයෝගය ලබාදුන් කර්යමණ්ඩලයේ සියලු දෙනාට මාගේ ස්තුතිය පුද කරන අතර මෙම කර්මාන්තයේ තිරසාර පැවැත්ම සඳහා අනාගතයේදීත් ඔවුන්ගේ උපරිම ශක්තිය ලබා ආයතනයේ සාර්ථකත්වයක් උදාවී රටට අභිමානයක් ඇතිවන පරිදි කටයුතු කිරීමට හැකිවේවා යයිද ප්‍රාර්ථනය කරමි.

ගෘහනිර්මාණ ශිල්පී සරත් ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වගකීම්, විගණකවරුන්ගේ වගකීම්වලට වඩා වෙනස් වේ.

මුදල් පනතේ විධිවිධාන අනුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මූල්‍ය වර්ෂය අවසානයේදී ආයතනයේ කටයුතුවල තත්ත්වය සහ එහි මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මකින් යුතුව එක් එක් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අවශ්‍ය වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන ස්ථාවර ආකාරයෙන් භාවිතා කර සාධාරණ සහ විවක්ෂණ විනිශ්චයක් මඟින් සහාය ලබා දී ඇති බවත් අදාළ වන පරිදි සුදුසු සියලුම ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ඇති බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකනු ලබයි.

ආයතනයේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වීමට ප්‍රමාණවත් සම්පත් ඇති බවත්, මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ආයතනයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සැලකිල්ල යොමු කර ඇති බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විශ්වාස කරයි. තවද, ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් හෙළිදරව් කිරීමට ප්‍රමාණවත් ගිණුම් වාර්තා ආයතනය විසින් පවත්වාගෙන යන බවට සහතික කිරීම සහ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මුදල් පනතේ අවශ්‍යතාවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට වගකීමක් තිබේ.

ආයතනයේ වත්කම් ආරක්ෂා කිරීමට සාධාරණ පියවර ගැනීම සහ මේ සම්බන්ධයෙන් වංචා සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට සුදුසු අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කිරීම පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්වීම අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වගකීම වේ.

මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා සිය වගකීම් ඉටු කර ඇති බව ඔහු විශ්වාස කරයි. එමෙන්ම, අධ්‍යක්ෂ ජනරාල්වරයා ද තම දැනුමට අනුව ශේෂ පත්‍රයේ දිනට ආයතනය විසින් කරන ලද සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා ඇති බව හෝ අදාළ ලෙස මූල්‍ය ප්‍රතිපාදන සපයා ඇති බව ද තහවුරු කරයි.

ආයතනය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව

හැඳින්වීම

පේෂකර්ම හා ඇඟලුම් ආශ්‍රිත සේවාවන් සැපයීමට ප්‍රසිද්ධියක් දරන ආයතන අතරින් ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (**SLITA**), පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රය නියෝජනය කරන රජයේ සුවිශේෂී හස්තය වශයෙන් පුරෝගාමී ආයතනය ලෙස කැපී පෙනෙන ස්ථානයක් හිමි කරගෙන ඇති අතර පසුගිය දශක කිහිපය තුළ පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රය ආශ්‍රිත ව්‍යාපාරික ලෝකයෙහි කටයුතු කරනු ලබයි. මෙම ආයතනය ආයතනය පුහුණු, පරීක්ෂණ සහ තාක්ෂණික සහ උපදේශන සේවා ආදී සිය මූලික ව්‍යාපාරික මෙහෙයුම් තුළ අසමසම සේවා සපයමින් එහි සේවා ලබන්නන්ට ශක්තිමත් පැවැත්මක් ලබා දී සුවිශේෂී කර්තව්‍යයක් ඉටු කරනු ලබන අතර කර්මාන්තය ගොඩනැඟීමට සහ එහි විභවතාව සහ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා කර්මාන්ත අංශයේ සේවාවන් භාවිතා කරනු ලබයි. එහි ප්‍රථලයක් වශයෙන්, කර්මාන්තකරුවන්ට ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ස්ථාවර බවට පැමිණ අතිශය ලාබ උපයන තත්ත්වයට පත්වීම සඳහා ඔවුන්ගේ ම හැකියා මුවහත් කර ගැනීමට හැකි වී තිබේ. මෙම ප්‍රවණතාවය නොනැවතී අඛණ්ඩව පවතින අතර අපගේ සංවිධානයේ සහ දැනුම පිළිබඳ අභිප්‍රේරණ බලවේගය ලෙස අපගේ දායකත්වයෙන් නවතම කර්මාන්ත ඉල්ලීම් සහ අවශ්‍යතා සමඟ වර්ධනය වීමට අපේක්ෂා කරමු.

පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයේ ගෝලීය වේදිකාව තුළ නිෂ්පාදන කාර්ය ක්ෂේත්‍රයෙහි නවීන තාක්ෂණික ක්‍රමවල වර්ධනයන් සමඟ ප්‍රවණතා ගතික සහ විප්ලවීය වන අතර පරිශීලකයින් ඔවුන්ගේ තෘප්තියට සරිලන සුදුසු ම නිෂ්පාදනය තෝරා ගැනීම සම්බන්ධයෙන් පෙර නොවූ විරූ ලෙස බුද්ධිමත් ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදකයින් මේ වන විට වෙළඳපොළ කරා යැවෙන ස්වකීය නිෂ්පාදන ඒවා පරිශීලනය කරන්නන්ගේ රුචිකත්වයට ඔබින බව සහතික කරගැනීමට සුපරීක්ෂාකාරී ලෙස කටයුතු කරයි. පාරිභෝගිකයින් වෙළඳපොලේ අපූර්වත්වයෙන් යුතු සහ දෝෂ රහිත නිෂ්පාදන සොයන බැවින් අද වන විට නිෂ්පාදනය සහ පාරිභෝගික ප්‍රසාදය අතර පවතින්නේ තරඟයකි.

මෙම ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය, පුහුණු ආයතනයක් වශයෙන් කර්මාන්තයට දූරදර්ශී නායකයින් බිහිකිරීමෙහිලා ප්‍රධාන වශයෙන් දායකත්වය සපයනු ලැබේ. නැඟී එන පේෂකර්ම හා ඇඟලුම් ආශ්‍රිත ව්‍යාපාරික ලෝකයට අවශ්‍ය මූලික ව්‍යාපාරික සේවා ලෙස පුහුණු කිරීම, පරීක්ෂණ කටයුතු සහ උපදේශන සේවා සපයන බැවින් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයෙහි කාර්යභාරය අතිශය වැදගත් වේ. ගෝලීය වෙළෙඳපොළ තුළ භාවිතයට නොගත් අවස්ථා සොයා බැලීම සඳහා ආයතනය මේ වන විට පාසල් හැර යන්නන් මෙන් ම කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවයේ නියුතු පුද්ගලයින් යන දෙපාර්ශවය ම වෙත කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ඉල්ලුමක් ඇති විවිධ විෂයයන් පිළිබඳව පුහුණුව ලබාදීමට සූදානමෙන් සිටියි.

ගෙවුණු වසර කිහිපය තුළ ආයතනය පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් සැලකිය යුතු ආදායමක් උපයාගෙන ඇති අතර පරීක්ෂණ කටයුතු මඟින් උපයාගත් ආදායම සාමාන්‍ය මට්ටමක පවතියි. ආයතනයට ඇතුළත්වන ශිෂ්‍ය සංඛ්‍යාව සත්‍ය ලෙස ම ශීඝ්‍රයෙන් ඉහළ යමින් දහස් ගණනකට ළඟා වෙමින් පවතින අතර ඉදිරි වසරවලදී සිසුන් ඇතුළත් කිරීම් වැඩි කිරීමට තවත් පහසුකම් සැලසුම් කර තිබේ. එමෙන්ම ඵලදායිතා සංකල්පය ජනප්‍රිය වෙමින් පවතින බැවින් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල තුළ තරඟ කිරීම සඳහා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම් අවශ්‍ය වන විශේෂිත පුහුණු වැඩසටහන් අදාළ කර්මාන්තයන්හි නියැලෙන්නන් වෙත පිරිනමනු ලැබේ. මීට සමගාමීවල අඩු පහසුකම් සහිත දිස්ත්‍රික්කවල ප්‍රජාවන්ට දැනුම ලබා දීම සඳහා ගෘහ කර්මාන්ත සඳහා පුහුණු පාඨමාලා සැපයීම කෙරෙහි ආයතනය ස්වකීය සේවාවන් අතර ප්‍රධාන ස්ථානයක් ලබා දී තිබෙන අතර එම ප්‍රදේශයන්හි ප්‍රජාවට ධරණීය සංවර්ධනය ඔස්සේ සිය ජීවන මට්ටම් ඉහළ නංවා ගැනීමට අවස්ථාව හිමි වී තිබේ. ආයතන සංවර්ධන මාවතේ ප්‍රගතිය කරා ගමන් කරමින් සිටින බැවින් ආයතනයට වර්ධනය වීමට විශාල ව්‍යාපාරික අවස්ථා රැසක් උදා කිරීම කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වා තිබේ.

පාලක මණ්ඩලය

ආයතනයේ ප්‍රතිපත්ති හා නීතිරීති සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පාලක මණ්ඩලය වෙත පැවරී ඇති අතර එම තීරණ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. පාලක මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වෙන අතර ප්‍රගතිය සහ ක්‍රියාකාරකම් සහ ආයතනයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධ නිශ්චිත මාර්ගෝපදේශ සමාලෝචනය කිරීමත් මෙහි දී සිදු කෙරේ.

<u>2020.12.31 දිනට පාලක මණ්ඩලය</u>

1	ආර්.සුනේත්‍රා ගුණවර්ධන මිය	සභාපතිනිය	බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය
2	යොහාන් ලෝරන්ස් මහතා	සාමාජික	ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය
3	මහාචාර්ය යූ.ජී.එස්. විජයපාල මිය	සාමාජික	මොරටුව විශ්වවිද්‍යාලය
4.	කේ.එච්.බන්දුල ප්‍රනාන්දු මහතා	සාමාජික	රෙදිපිළි අපනයනකරුවන්ගේ සංගම් මණ්ඩලය
5.	ෆිලික්ස් ප්‍රනාන්දු මහතා	සාමාජික	ශ්‍රී ලංකා ඇඟලුම් අපනයනකරුවන්ගේ සංගමය
6.	සුරේෂ් ඉන්දික මහතා	සාමාජික	ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තය
7.	ඩී.ඒ.එස්. දහනායක මහතා	සාමාජික	මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
8.	අංජලී වීරසිංහ මිය	සාමාජික	කර්මාන්ත අමාත්‍යාංශය
9	චන්දන පුෂ්පකුමාර මහතා	සාමාජික	ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තය

2020.12.31 දිනට කාර්ය මණ්ඩලය

මුළු කාර්ය මණ්ඩලය– 100

වර්ගය	කළමනාකරණ හා මෙහෙයුම්	තාක්ෂණික/ මෙහෙයුම්	මූල්‍ය	පොදු / පරිපාලන
සේවකයන්	05	56	04	27
පුහුණුවන්නන්	-	5	-	-
පැවරුම් පදනම	-	2	1	-

පී.සරත් ඩබ්ලිව්.කේ. ප්‍රනාන්දු - අධ්‍යක්ෂ ජනරාල්
B.Sc (BE), M.Sc (Arch), RIBA, AIA (SL)

එස්. ඉලංගෝවන් මහතා - අධ්‍යක්ෂ (පුහුණු සහ තාක්ෂණ)
B.Sc. (Eng.) (Text),MBA,AMIE(SL)

පී.වී.එස්. විජයරත්න - අධ්‍යක්ෂ මෙහෙයුම්
M.Sc.(MIT), M.Sc (Mgt.), B.Tech(Eng.)Hons
AMIE(SL),LLB

එම්.පී.කන්නංගර මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)
MBA(P.I.M.)
B.Sc.(Col.), PG. Dip in International Rel:(BCIS)
Dip.in American Professional Qualification-HRM
LLB (UG),Diploma in Legal Studies.

වයි.ඒ.පී.ජී.යාපා මහත්මිය - ගණකාධිකාරී
MPAcc, B.Com (Special) , CBA

එම්.එස්.එම්. ඉල්හාම් - අභ්‍යන්තර විගණක
HNDA,ACPM

ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය

ජී.කේ.කේ.එස්.කුමාර මහතා - ප්‍රධාන තාක්ෂණඥ, B.Sc.(Eng.) (Text),MBA,AMIE(SL)

බී.එල්.එස්.පී.නිශාන්ත මහතා - ප්‍රධාන තාක්ෂණඥ, B.Sc. (Hons.),M.Sc.(Text.)

ජේ.පී.සමරකෝන් මහතා - ප්‍රධාන තාක්ෂණඥ, NDT (Mech)


කේ.ඒ.ආර්.වී.අබේවර්ධන මිය - ප්‍රධාන තාක්ෂණ, NDT (Text. Tech.)


කේ. ජෙගදීසන් මහතා - ප්‍රධාන තාක්ෂණඥ, B.Sc.(Eng.)(Text),M.Sc.(Text),AMIE(SL)

ඩබ්ලිව්.එම්.එස්.කේ.විජේබාහු මහතා- ප්‍රධාන තාක්ෂණඥ, B.Sc. (Eng.),M.Sc (Text),AMIE(SL)


කාර්යසාධනයේ විශේෂ අවස්ථා


1. මූල්‍ය කාර්යසාධනය





2. භෞතික කාර්යසාධනය





ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී උපයෝගී කරගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

1. පිළියෙළ කිරීමේ පදනම

(i) උපචිත පදනම මත ගිණුම්කරණය සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුකූල වේ. ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති අතර සමස්ත කාලසීමාව පුරාම ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරතුරුවම භාවිතා කර තිබේ.

(ii) ලිත් වර්ෂය ආයතනයේ මූල්‍ය වර්ෂය වේ.

(iii) ආයතනයේ මූල්‍ය පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් 1971 අංක 38 දරන මූල්‍ය පනත අදාළ කරගනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. දේපළ, පිරියත සහ උපකරණ

ඉඩම් හැර සියලුම යටිතල පහසුකම් දේපළ, පිරියත සහ උපකරණ ඓතිහාසික පිරිවැය/ගණනය කළ මිලෙන් සමුච්චිත ක්ෂය අඩු කර දක්වා ඇත.

පිරිවැය ගණනය කිරීමේදී වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සඳහා සුදුසු තත්ත්වයට ගෙන ඒම වෙනුවෙන් දරන ලද සියලුම වියදම් පිරිවැයට එකතු කර තිබේ. විශේෂිත අලුත්වැඩියාවක් මඟින් වත්කමක මූලික වශයෙන් ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය දීර්ඝ කරන්නේ නම් හෝ නැවත අය කරගත හැකි අගය වැඩි කරන්නේ නම් එම අලුත්වැඩියා කටයුතු ප්‍රාග්ධනිත කරනු ලැබේ. නඩත්තු කිරීම්, අලුත්වැඩියා සහ සුළු අලුත්වැඩියා කටයුතු සඳහා ලද ආදායම මඟින් අයකර තිබේ.

අපහරණය කරනු ලබන යටිතල පහසුකම්, පිරියත හා උපකරණවල පිරිවැය අනුරූප සමුච්චිත ක්ෂයවීම් සමඟ ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ. බැහැර කිරීම්වල ලාභ සහ අලාභ ඒවායේ ධාරණ අගය මත තීරණය කරනු ලබන අතර මෙහෙයුම් ලාභය තීරණය කිරීමේදී ද එය සැලකිල්ලට ගනු ලැබේ.

2. ක්ෂයවීම්

ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් ගණනය කරනු ලබන්නේ පහත ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය තුළ එවැනි සමාන වාරිකවලින් කපා හැරීම සඳහා සියලු දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය පිළිබඳ සරල රේඛීය ක්‍රමයක් භාවිතා කිරීමෙනි.

ක්ෂයකිරීම් සඳහා පහත දැක්වෙන අනුපාතයන් භාවිතා කරනු ලැබේ.

ගොඩනැඟිලි	2.5%
පිරියත සහ යන්ත්‍ර	10%
ගෘහභාණ්ඩ, වැද්දුම්, සවිකිරීම් සහ උපකරණ	10%
ආපනශාලා උපකරණ	10%
මෝටර් වාහන	10%
පරිගණක සහ මෘදුකාංග	20%
ග්‍රන්ථ සහ වාර සඟරා	10%
විද්‍යාගාර උපකරණ	10%
වීඩියෝ වැඩසටහන්	25%
කාර්මික මහන මැෂින්	10%

වර්ෂයේ පළමු භාගයේ දී අත්පත් කරගත් වත්කම් සඳහා සම්පූර්ණ ක්ෂයවීම් අනුපාතය අය කරනු ලබන අතර වසරේ දෙවන භාගය තුළ අත්පත් කර ගැනීම සඳහා 50% ක්ෂය අනුපාතය අය කරනු ලැබේ.

3. භාණ්ඩ තොග

ආයතනය විසින් සිය සේවා සැපයීමේදී භාවිතා කිරීමට සියලුම භාණ්ඩ තොග තබා ඇත. භාණ්ඩ තොග අඩු පිරිවැයකට සහ ශුද්ධ උපලබ්ධි අගයකට දක්වා තිබේ. පිරිවැය තීරණය කරනු ලබන්නේ ප්‍රථම ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමවේදයට (FIFO) අනුවයි.

4. වෙළඳ ලැබීම්

වෙළඳ ලැබීම් මුල් ඉන්වොයිස්පතෙහි අගයට දක්වා තිබේ.

5. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල්, තැන්පතු සහ මාස තුනක හෝ ඊට අඩු මුල් කල්පිරීමකින් සමන්විත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන වලින් සමන්විත වේ.

6. වෙන්කිරීම්

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනය සතුව වර්තමාන නෛතික හෝ අර්ථකාරී බැඳියාවන් ඇති විට ප්‍රතිපාදන පිළිගනු ලැබේ. බැඳියාවන් පියවීම සඳහා සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇති අතර, බැඳියාවන් ප්‍රමාණය පිළිබඳ විශ්වාසදායක තක්සේරුවක් කළ හැකිය.

7. විදේශ මුදල් ගනුදෙනු

ගණුදෙණු කරන දින වල පවතින විනිමය අනුපාත මත විදේශ මුදල් ගණුදෙනු සඳහා ගිණුම්ගත කරනු ලබන අතර එම ගණුදෙණු පියවීමෙන් ලැබෙන ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

8 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන පාරිතෝෂික පනත සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 (LKAS 19) යටතේ ආයතනයේ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ ලබා දේ. මූලික වැටුපට ජීවන වියදම් දීමනා ඇතුළත් වේ.

9. නිශ්චිත දායකත්ව සැලැස්ම

ආයතනයේ සියලුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයන් වන අතර, එම සේවකයන්ගේ මූලික වැටුපෙන් පිළිවෙළින් 12% සහ 3% ජීවන වියදම් දීමනාව සමඟ ආයතනය දායකක්වය දක්වනු ලැබේ.

10. ආදායම් හඳුනාගැනීම

ශුද්ධ වට්ටම් සහිතව සේවා අලෙවිය සඳහා වන ඉන්වොයිස්පත් වටිනාකම අනුව උපචිත පදනමක් මත ආදායම හඳුනාගනු ලැබේ.

11. වියදම්

උපචිත පදනම මත වියදම් හඳුනාගනු ලැබේ. ආයතනය පවත්වාගෙන යාමේදී සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් එම කාලසීමාව සඳහා ලාභය අත්කරගැනීමේ ආදායමට අයකර තිබේ.

12. මුදල් ප්‍රවාහය

වක්‍ර ක්‍රමය පදනම් කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර තිබේ.

13. රජයේ ප්‍රදාන

වත්කම් හා මූල්‍ය නොවන ප්‍රදාන සම්බන්ධ රජයේ ප්‍රදාන නව ප්‍රමිතියට (LKAS20) අනුව ගිණුම්ගත කරනු ලැබේ. ප්‍රදානය ලැබෙනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇතිවිට ප්‍රදාන හඳුනාගැනෙන අතර අදාළ සියලුම කොන්දේසි වලට අනුකූල වේ. ප්‍රදානය වියදම් අයිතමයකට අදාළ වන විට එය වන්දි ගෙවීමට අදහස් කරන පිරිවැයට ක්‍රමානුකූල පදනමක් මත ප්‍රදානය ගැලපීමට අවශ්‍ය කාලසීමාව තුළ ආදායමක් ලෙස හඳුනා ගැනේ. ප්‍රදානය වත්කමකට අදාළ වන විට එය විලම්බිත ආදායමක් ලෙස සකසනු ලැබේ. ආයතනයට මූල්‍ය නොවන ප්‍රදාන ලැබෙන විට වත්කම් සහ එම ප්‍රදාන නාමික අගයන්ගෙන් සටහන් කර සමාන වාර්ෂික වාරික මඟින් අදාළ වත්කම්වල අපේක්ෂිත ඵලදායී ජීව කාලය පිළිබඳ ආදායම් ප්‍රකාශය වෙත මුදා හරිනු ලැබේ.

පොදු අනාවරණය කිරීම

1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 සහ 11 හි දක්වා ඇති මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ.

2. **භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු සහ ඇමතුම් තැන්පතුවල ආයෝජනය**
ඇමතුම් තැන්පතුවල ආයෝජන පිරිවැය ගිණුම්වල දක්වා තිබේ. භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන සහ ස්ථාවර තැන්පතු වල ආයෝජනය ගිණුම්වල සමුච්චිත වටිනාකමින් දක්වා ඇත.

3. බොල් ණයගැතියන් සඳහා වෙන්කිරීම්
වෙළඳ ලැබීම් අඩු කිරීම යටතේ බොල් ණයගැතියන් සම්බන්ධ වෙන්කිරීම් නියෝජනය වේ. ශ්‍රී ලංකාවේ මුදල් රෙගුලාසි වලට අනුකූලව ණය ගැතියන් විවිධ කණ්ඩායම්වලට කාණ්ඩ කරනු ලබන අතර බොල් ණයගැතියන් සඳහා වෙන්කිරීම් අනුගමනය කරමින් ඔවුන්ගේ ගෙවීම් රටාව අදාළ කරගනු ලැබේ.

කාල පරාසය	වෙන්කිරීම් ප්‍රතිශතය
දින <90	0%
දින 90 සිට 180 දක්වා	2%
දින 180 සිට 360 දක්වා	3%
දින 360 සිට 720 දක්වා	4%
දින 720 සිට 1080 දක්වා	5%
දින >1080	100%

4. භාණ්ඩ තොග
ආයතනය විසින් සිය සේවා සැපයීමේදී භාවිතා කිරීමට සියලුම භාණ්ඩ තොග තබාගෙන සිටියි. භාණ්ඩ තොග ප්‍රකාශ කර ඇත්තේ පිරිවැයෙන් අඩු සහ ශුද්ධ උපලබ්ධි අගයෙනි. පිරිවැය තීරණය කරනු ලබන්නේ ප්‍රථමයෙන් ලබාගත් භාණ්ඩ ප්‍රථමයෙන් ඉවත් කිරීමේ (FIFO) ක්‍රමය භාවිතා කරමිනි.

5. පාරිතෝෂික වෙන්කිරීම්
2014 වර්ෂයේ සිට පාරිතෝෂිත ප්‍රතිපාදනවල මුළු මුදල ස්ථාවර තැන්පතු මත ආයෝජනය කර ඇති අතර විශ්‍රාම පාරිතෝෂික ශීර්ෂය යටතේ දක්වා තිබේ

6. රජයේ ප්‍රදාන
ප්‍රදාන වලින් ප්‍රාග්ධන මිලදී ගැනීම්වල ක්ෂයවීම් කොටස විලම්භීත ආදායම වශයෙන් ගිණුම්ගත කරනු ලැබේ.

7. ප්‍රත්‍යාගණනය
ප්‍රත්‍යාගණන වාර්තාව සම්පූර්ණ කිරීම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ ඉදිරිපත් කර නොතිබිණි.

8. වත්කම් බැහැරකිරීම

බැහැර කිරීමේ ක්‍රියාවලිය සහ සියලුම ගැලපීම් වර්ෂය තුළ අවසන් කරන ලදී.

9. කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල සඳහා වෙන්කිරීම්

මෙම වසර සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල සඳහා වෙන්කිරීම් පනතට අනුව ප්‍රතිසාධනය මත 0.5% ක් වශයෙන් ගණනය කරන ලදී.

10. ප්‍රාග්ධන ප්‍රදාන

මේ යටතේ අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ලදී.

- සෞඛ්‍ය සහ ආරක්ෂණ ව්‍යාපෘතිය
- පුස්තකාල ස්වයංක්‍රීයකරණය සහ එකතු සංවර්ධන ව්‍යාපෘතිය

11. ව්‍යාපෘති

ව්‍යාපෘති හතරක් ආරම්භ කරන ලද අතර ඒ සඳහා අරමුදල් ලැබුණේ වර්ෂය අවසානයේදී ය. එම ව්‍යාපෘති 2021 වර්ෂයේ දී අවසන් වීමට නියමිත ය.

- මැහුම් විද්‍යාගාරය වැඩිදියුණු කිරීම සහ පන්ති කාමර සංවර්ධනය.
- බතික් පුහුණු පාඨමාලාව
- ඇඳුම් මෝස්තර නවෝත්පාදන සහ පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයෙහි ස්ථාපනය කිරීම.
- පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංඛ්‍යාන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම.

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන් අංකය	2020	2019
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	285,088,937	267,137,133
ලැබියයුතු දෑ	2	51,041,649	49,186,878
තොග	3	2,993,173	2,631,283
පෙර ගෙවුම්	4	1,240,833	1,172,960
ප්‍රාග්ධන කාර්යයන් සඳහා කළින් ගෙවන ලද මුදල්	5	3,762,601	22,102,761
වෙනත් ජංගම වත්කම්	6	9,376,211	10,655,409
මුළු ජංගම වත්කම්		**353,503,404**	**352,886,424**
ජංගම නොවන වත්කම්			
යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ (ශුද්ධ)	7	98,571,610	102,527,165
ඉඩම් සහ ගොඩනැඟිලි (ශුද්ධ)	8	61,738,108	47,245,512
		160,309,719	**149,772,677**
මුළු වත්කම්		**513,813,122**	**502,659,101**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවීම්	9	14,807,171	16,892,060
කෙටි කාලීන වෙන්කිරීම්	10	2,984,900	1,803,295
		17,792,071	18,695,355
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම පාරිතෝෂික	11	50,956,958	43,911,044
		50,956,958	43,911,044
මුළු වගකීම්		68,749,029	**62,606,399**
ශුද්ධ වත්කම්		**445,064,094**	**440,052,703**
ශුද්ධ වත්කම්/ ස්කන්ධ			
රජයේ දායකත්වය සහ විදේශීය ආදයම	12	141,225,370	161,932,729
	13	27,293,819	2,740,072
සමුච්චිත අතිරික්තය (ක්ෂය)	14	276,544,905	275,379,902
මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය		**445,064,094**	**440,052,703**

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය වගකීම් දරනු ලබයි.

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.02.18 දින අනුමත කර අත්සන් තබන ලදී.

.....	.....	.....
මණ්ඩල සාමාජික	**ගණකාධිකාරී**	**සභාපති**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

2020.12.31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

	සටහන් අංක	***2020*** *රු.*	***2019*** *රු.*
ආදායම්			
ගාස්තු සහ වෙනත්	**15**	**162,175,048**	**182,923,000**
මුළු මෙහෙයුම් ආදායම		**162,175,048**	**182,923,000**
වියදම්			
පුද්ගල පඩිනඩි (වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ)	16	109,599,533	100,499,756
ගමන් වියදම්	17	547,900	1,037,300
සැපයුම් සහ භාවිතා කරන ලද පාරිභෝගික භාණ්ඩ	18	8,200,952	11,465,526
අළුත්වැඩියා සහ නඩත්තු	19	11,281,053	5,540,725
ගිවිසුම් සේවා	20	15,616,951	20,041,763
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	21	25,637,035	24,191,721
වෙනත් වියදම්	22	12,871,288	23,634,745
මූල්‍ය පිරිවැය	23	75,148	182,001
		183,829,861	**186,593,536**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්තය (හිඟය)		**(21,654,813)**	**(3,670,535)**
වෙනත් ආදායම්			
විලම්භිත ආදායම	24	23,110,221	23,015,726
වෙනත් මුළු පිරිවැය		**23,110,221**	**23,015,726**
කාලපරිච්ඡේදය සඳහා මුළු අතිරික්තය/ (ඌනතාවය)		**1,455,408**	**19,345,190**

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරනු ලබයි.මෙම මූල්‍ය ප්‍රකාශන 2021.02.18 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් තබන ලදී.

.....	.....	.....
මණ්ඩල සාමාජික	**ගණකාධිකාරී**	**සභාපති**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

2020. 12. 31 වන දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	උපලේඛන අංකය	2020 රු.	2019 රු.
කාලසීමාව සඳහා අතිරික්තය/ (හිඟය)		1,455,408	19,345,190
ගැළපුම්			
ක්‍රමක්ෂයවීම් - විලම්බිත ආදායම		(23,110,221)	(23,015,726)
ක්ෂයවීම්		25,637,035	24,191,721
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය/ (හිඟය)		3,982,222	20,521,185
පාරිතෝෂික වෙන්කිරීම් වැඩිවීම		8,584,374	7,833,855
භාණ්ඩ තොග (වැඩිවීම්)/ අඩුවීම්		(361,889)	112,889
පෙර ගෙවුම් (වැඩිවීම්)/ අඩුවීම්		(67,873)	58,753
වෙනත් ජංගම වත්කම් (වැඩිවීම්)/ අඩුවීම්		1,279,198	(1,744,584)
වෙළඳ සහ වෙනත් ලැබීම් (වැඩිවීම්)/ අඩුවීම්		(1,854,771)	13,455,862
පූර්ව වර්ෂයේ නිහ පහළයාම		(290,405)	(4,536,175)
වෙළඳ සහ වෙනත් ගෙවීම්වල වැඩිවීම		(2,084,889)	6,280,218
වෙන්කිරීම් වැඩිවීම		1,181,605	(345,332)
දෝෂ නිවැරදි කිරීම - ප්‍රාග්ධනීත අත්තිකාරම් ගෙවීම		-	1,759,857
බැහැරකිරීම් වලින් ලද ලාභය		4,004	(54,635)
දෝෂ නිවැරදිකිරීම - ගිණුම් අංශය - පොත් සහ වාරසඟරා		146,441	-
දෝෂ නිවැරදි කිරීම -ආපනශාලා අත්තිකාරම් ගෙවීම		-	(43,996)
ගෙවන ලද පාරිතෝෂික මුදල්		(1,538,460)	(1,928,810)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**8,979,557**	**41,369,088**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
පිරියත සහ උපකරණ අත්කරගැනීම්		(36,413,082)	(20,780,502)
ප්‍රාග්ධන වියදම් සඳහා අත්තිකාරම් ගෙවීම්		18,340,160	(18,251,849)
වත්කම් බැහැර කිරීම්		88,560	60,310
මානව සම්පත් සංවර්ධනය		-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(17,984,361)**	**(38,972,041)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය			
ප්‍රාග්ධන ප්‍රදාන (මුදල්)		-	3,857,000
ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම්)		2,402,862	19,030,134
වෙනත් ප්‍රදානයන්හි වෙනස්කම්		-	-
වෙනත් ව්‍යාපෘතීන්හි වෙනස්කම්		24,553,747	(16,179,469)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**26,956,609**	**6,707,665**
මුදල් හා මුදල් සමානදැනි ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**17,951,805**	**9,104,712**
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ		**267,137,133**	**258,032,421**
කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**1**	**285,088,937**	**267,137,133**

උපලේඛන අංක 1

මුදල් හා මුදල් සමාන දෑ

	2020
බැංකුවේ ඇති මුදල්	
ලංකා බැංකුව - රත්මලාන (ගිණුම් අංක 9521019)	1,242,957
රත්මලාන ලංකා බැංකුවේ විදෙස් මුදල් (ගිණුම් අංක 7011691)	1,739,463
කෙටි කාලීන ආයෝජන	
ස්ථාවර තැන්පතු	4,777,943
	16,676,387
ඇමතුම් තැන්පතු (පාරිතෝෂික අරමුදල ඇතුළත්ව)	260,652,186
	285,088,937

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

2020. 12. 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය

	උපලේඛන	දායක ප්‍රාග්ධනය	වෙනත් සංචිත	භාෂා පරිවර්තන සේවා	සමුච්චිත අතිරික්තය/	මුළු ශුද්ධ වත්කම්/
		රු.	රු.	රු.	රු.	රු.
2019.12.31 දිනට ශේෂය	1	164,672,801	-	-	275,379,902	440,052,703
ගිණුම් ප්‍රතිපත්තියේ වෙනස්කම්		-	-	-	-	-
වර්ෂය තුළ ශුද්ධ වත්කම් / ස්කන්ධ වෙනස්වීම්	2	3,846,388	-		(290,405)	3,555,983
දේපළ ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය		-	-	-	-	-
ආයෝජන ප්‍රත්‍යාගණනයෙන් ලද අලාභය		-	-	-	-	-
විදෙස් මුදල් පරිවර්තනයේදී ලද අලාභය		-	-	-	-	-
ශුද්ධ වත්කම්/ ස්කන්ධ මගින් සෘජුව හඳුනාගත් ශුද්ධ ආදායම්		3,846,388	-	-	(290,405)	3,555,983
කාලසීමාව සඳහා ලද හිහය/ අලාභය		-	-	-	1,455,408	1,455,408
කාලසීමාව සඳහා හඳුනාගත් මුළු ආදායම						-
2020.12.31 දිනට අවසන් ශේෂය		**168,519,189**	**-**	**-**	**276,544,905**	**445,064,094**

උපලේඛන අංක. 1 රු.

දායක ප්‍රාග්ධනය

2019.12.31 දිනට රජයේ දායකත්වය සහ විදෙස් ආධාර ශේෂය	161,932,729
2019.12.31 දිනට වෙනත් ව්‍යාපෘතිවල මුළු ශේෂය	2,740,072
	164,672,801

උපලේඛන අංක 2

වර්ෂය තුළ ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීම්

වර්ෂය තුළ ප්‍රාග්ධන ලාභ	2,402,862
වර්ෂය තුළ වත්කම් ක්‍රමක්ෂයවීම	(23,110,221)
වර්ෂය තුළ වෙනත් ව්‍යාපෘතීන්හි වෙනස්කම්	24,553,747
	3,846,388

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් තවදුරටත්

	මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		2020 රු.	2019 රු.
1	**මුදල් හා මුදල් සමාන දෑ**			
	බැංකුවේ ඇති මුදල්			
	ලංකා බැංකුව - රත්මලාන (ගිණුම් අංකය 9521019)		1,242,957.35	4,281,161.21
	ලංකා බැංකුව - රත්මලාන විදෙස් මුදල් (ගිණුම් අංකය 7011691)		1,739,462.81	1,168,917.36
	කෙටි කාලීන ආයෝජන (හෙළිදරවිකිරීම් අංක .2)	1.1	282,106,517.12	261,687,054.25
			285,088,937.28	**267,137,132.82**
1.1	**කෙටි කාලීන ආයෝජන (හෙළිදරවිකිරීම් අංක 2)**			
	ස්ථාවර තැන්පතු (පාරිතෝෂික අරමුදල)		4,777,943.39	4,323,930.63
	භාණ්ඩාගාර බිල්පත් (පාරිතෝෂික අරමුදල)		16,676,387.27	15,681,586.19
	ඇමතුම් තැන්පතු (පාරිතෝෂික අරමුදල ඇතුළත්ව)		260,652,186.46	241,681,537.43
			282,106,517.12	**261,687,054.25**
2	**ලැබීම්**			
	වෙළඳ ලැබීම් (හෙළිදරවිකිරීම් අංක 3)			
	ණයගැතියන් පරීක්ෂණ	**2.1**	38,158,217.00	4,755,234.27
	පුහුණු කිරීම- අභ්‍යන්තර ණයගැතියන්	**2.2**	7,491,012.80	4,254,340.80
	පුහුණු කිරීම - බාහිර ණයගැතියන්	**2.3**	161,600.00	320,720.00
	උපදේශන සේවා සපයනු ලබන ණයගැතියන්	**2.4**	268,558.88	552,558.88
	ගනුදෙනුකාර/ තාක්ෂණික සේවා සපයනු ලබන ණයගැතියන්	**2.5**	92,556.00	199,088.00
	වෙනත් වෙළඳ ණයගැතියන්	**2.6**	1,919,001.45	963,660.56
			48,090,946.13	**11,045,602.51**
	අඩු කළා - බොල් ණය සඳහා වෙන්කිරීම්		(5,126,099.54)	(4,409,394.31)
			42,964,846.59	6,636,208.20
	විවිධ ණයගැතියෝ	**2.7**	8,076,802.84	42,550,670.00
			51,041,649.43	**49,186,878.20**
2.1	**ණයගැතියන් පරීක්ෂණ**			
	ඇල්ෆා ඇපරල්ස්		98,600.00	236,852.00
	බෑම් නිට්ං පුද්ගලික සමාගම		38,100.00	-
	බෙන්ජි ලිමිටඩ්		-	78,325.00
	බර්නාඩ් ෆිල් නිට් (සිලෝන්) ලිමිටඩ්		-	-
	බ්‍රැන්ඩික්ස් ඇපරල් ප්‍රයිවට් ලිමිටඩ්		19,317.75	19,317.75
	බ්‍රැන්ඩික්ස් ඇපරල් ලිමිටඩ් - එෆ්සී		2,761.20	2,761.20
	බ්‍රැන්ඩික්ස් කැෂුවල් වෙයාර් ලිමිටඩ් - එෆ්සී		1,727.52	1,727.52
	බ්‍රැන්ඩික්ස් ඉන්ටිමේට් ඇපරල්ස් ලිමිටඩ්		4,830.00	4,830.00
	කැලිකෝ (ප්‍රයිවට්) ලිමිටඩ්		4,950.00	-
	සෙල්සියස්සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්		-	19,656.00
	සිවිල් ආරක්ෂක		33,450.00	33,450.00
	ක්ලින්ටෙක්ස් ඉන්ඩස්ට්‍රිස් ලිමිටඩ්		950.00	37,325.00
	පොල් වගා මණ්ඩලය		-	16,848.00
	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය		5,255.04	5,255.04
	ක්‍රියේටිව් ටෙක්ස්ටයිල් මිල්ස් - සාමාන්‍ය පරීක්ෂා		-	11,043.00
	ක්‍රියේටිව් ටෙක්ස්ටයිල් මිල්ස් - පාසල් නිලඇඳුම්		13,372,245.00	-
	ක්‍රියේටිව් ටෙක්ස්ටයිල් මිල්ස් - හමුදා නිලඇඳුම්		4,142,800.00	1,038,964.63
	ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව		-	19,818.00
	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව		-	47,196.00
	ආගමන විගමන දෙපාර්තමේන්තුව		1,433.18	1,408.18
	මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව		1,900.00	-
	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව		-	23,328.00
	ඩීජී ෆැෂන්ස් ගාමන්ට්ස් (පුද්ගලික) සමාගම		7,539.84	7,539.84
	ඩෙලින්ක් සහ මධුෂානි ප්‍රඩක්ට්ස්		-	-
	ශ්‍රී ලංකා යුධ හමුදාවේ යුධෝපකරණ සේවා බලකාය		248,600.40	248,600.40
	ඇඟලුම් තාක්ෂණ දෙපාර්තමේන්තුව		16,050.00	-
	ෆයර්ෆ්ලයිස් ෆෝ ලැන්ටර්න්ස්		-	17,419.05
	ජනරල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය		22,111.05	22,111.05
	ජෙනුයින් ටීෂර්ට්		3,450.00	-
	ජී පී ගාමන්ට්ස් (පුද්ගලික) සමාගම		-	169,614.50
	හර්ෂ ඉන්ටර්නැෂනල් ලිමිටඩ් - හමුදා		88,000.00	4,809.30
	හෙළ ක්ලෝදින් (පුද්ගලික) සමාගම		570.80	570.80
	හෙළ ක්ලෝදින් (පුද්ගලික) සමාගම - එෆ්සී		44,999.21	44,999.21
	හෙළ මාර්කටිං ඇන්ඩ් ඩිසයින් සෙන්ටර්		9,775.00	9,775.00

	2020	2019
ඉරෝෂා ඉන්ටර්නැෂනල්	2,155.75	21,606.75
කබීර් හැන්ඩ්ලූම්	29,295.68	29,295.68
කුගා හෝල්ඩිංස් (පුද්) සමාගම	1,400.00	-
ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි ලිමිටඩ්	173,400.00	-
ලංකා සළුසල	36,896.30	27,096.30
මාර්ෂල් ට්‍රේඩිං කම්පැණි	7,650.00	-
මාස් ඇක්ටිව් (පුද්.) සමාගම - ලීනියා ඉන්ටිමෝ	90,600.00	219,475.00
මාස් ඇක්ටිව්	4,182.00	4,182.00
මාස් ඉන්ටිමේට්ස් (පුද්.) සමාගම	2,600.00	-
ආරක්ෂක අමාත්‍යාංශය	-	187,515.00
අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	6,740.16	6,740.16
අධ්‍යාපන අමාත්‍යාංශය	166,800.00	-
කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය	4,306,291.10	-
මිරාජ් ඉන්ඩස්ට්‍රීස් - හමුදා නිලඇඳුම්	21,134.40	21,134.40
පෙන්ගුවින් ලෙෂර්වෙයාර් (පුද්) සමාගම	26,128.58	26,128.58
පොලිස් මූලස්ථානය	111,908.94	111,908.94
ප්‍රභා ටෙක්ස්ටයිල් ඉන්ඩස් ට්‍රීස් - පාසැල් නිලඇඳුම්	4,747,100.00	-
ප්‍රභා ටෙක්ස්ටයිල් ඉන්ඩස් ට්‍රීස් - යුධ හමදා නිලඇඳුම්	22,175.00	77,760.00
රේඩියන්ට් ටෙක්ස්ටයිල්	2,463.30	2,463.30
රෙයින්වෙයාර් අපරල් (පුද්.) සමාගම	1,600.00	-
රජිත ටෙක්ස්ටයිල්ස් - හමුදා නිලඇඳුම්	157,700.00	281,238.70
රතන්ජනා ටෙක්ස්ටයිල්	16,832.55	16,832.55
රෙජිස්ට්‍රාර් - මහේස්ත්‍රාත් අධිකරණය	49,999.99	49,999.99
රයිනො කන්සල්ටන්ට්ස් ඇන්ඩ් ෆැසිලිටේටර්ස්	33,600.00	-
සරසවි ඉන්ඩස්ට්‍රීස් - හමුදා නිලඇඳුම්	96,800.00	-
එස්.ජී.එස්. ලංකා (පුද්) සමාගම	11,850.00	35,813.72
සින්ගී ලංකා (පුද්) සමාගම	12,850.47	12,850.47
සින් මාර් කළමබු (පුද්) සමාගම	50,375.00	15,410.03
සිරියෝ සමාගම	-	80,275.00
ස්කැන්ස්කෝ ට්‍රේඩිං (පුද්) සමාගම	-	20,628.00
ස්පෙන්සර් ඩෙනිම් ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම	1,583.55	1,583.55
ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය	1,018,250.00	408,592.00
ශ්‍රී ලංකා යුධ හමුදාව	85,445.32	85,445.32
ශ්‍රී ලංකා රේගුව	17,595.00	17,595.00
ශ්‍රී ලංකා හෝම් ගාඩ් පෝසස්	17,250.00	17,250.00
ශ්‍රී ලංකා නාවික හමුදාව	443,036.94	260,415.72
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	104,305.00	805.00
ස්ටාර් ටෙක්ස්ටයිල් ප්‍රොසෙසිං ඉන්ඩස්ට්‍රීස්	-	181,440.00
එස් ඇන්ඩ් එස් සේෆ්ටි ඉක්විප්මන්ට් හෝල්ඩිංස්	23,973.10	23,973.10
සුපර් ෆැෂන් ගාමන්ට්	523.43	523.43
ටෙක්ස්ලාන් සෙන්ටර් (පුද්) සමාගම	-	5,202.00
ටෙක්ස්ප්‍රින්ට් ලංකා (පුද්) සමාගම	3,000.00	-
තිසන්වා ඒන්ටර්ප්‍රයිසස්	-	18,468.00
ට්‍රයිස්ටාර් ඇපරල් (පුද්) සමාගම	790.00	790.00
යුනියන් කළමබු වොෂිං	-	7,600.00
වැන්ගාර්ඩ් ඉන්ඩ්‍රස්ට්‍රීස්සමාගම	8,722.00	109,108.00
වැන්ගාර්ඩ් ඉන්ඩ්‍රස්ට්‍රීස්සමාගම - පාසල් නිලඇඳුම්	5,558,150.00	-
වැන්ගාර්ඩ් ඉන්ඩ්‍රස්ට්‍රීස්සමාගම - හමුදා නිලඇඳුම්	2,510,431.40	242,028.06
වර්වූ ටෙප් ඉන්ඩස්ට්‍රීස්	2,700.00	-
විනර් ගයිස්	2,516.05	2,516.05
	38,158,217.00	**4,755,234.27**

2.2 ණයගැතියන් අභ්‍යන්තර පුහුණුව

සිසුන්ගෙන් ලැබියයුතු පාඨමාලා ගාස්තු	6,539,035.00	2,755,735.00
ගුවන් හමුදා සේවා වනිතා ගාමන්ට් (කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය)	20,400.00	20,400.00
ඇල්ෆා ඇපරල්ස් සමාගම	16,200.00	16,200.00
බොඩිලයින් (පුද්.) සමාගම	-	76,500.00
බ්‍රෝඩ්වේ කිඩ්ස් (පුද්.) සමාගම	-	18,128.00
සෙල්සියස්(පුද්.) සමාගම	46,000.00	46,000.00
ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව	-	350,000.00
ඩයිනමික් ක්ලෝදින් (පුද්) සමාගම	7,650.00	7,650.00
එවරස්ට් ෆුට්වෙයාර් ඉන්ඩස්ට්‍රීස්	40,800.00	40,800.00
මැගි එන්ටර්ප්‍රයිසස්ලංකා (පුද්.) සමාගම	-	102,000.00
ජයාස් අර්වින්ද් එන්ටර්ප්‍රයිසස්ලිමිටඩ්	118,320.00	118,320.00
නෝර්ඩෙක්ස් (පුද්) සමාගම	54,840.00	54,840.00
එන්පීඑන් ලංකා ඇන්ඩ් කම්පැණි (පුද්) සමාගම	40,800.00	40,800.00
ඔබයිදනි ඇපරල් (පුද්) සමාගම	127,500.00	127,500.00
ගනුදෙනුකරුවන් එකවරක් පමණක් පුහුණු කිරීම	353,398.20	353,398.20
පැරඩයිම් ක්ලෝදිං (පුද්) සමාගම	3,750.00	3,750.00
පර්ලි ෆැෂන්	30,600.00	30,600.00
ප්‍රයිම් ඉන්මේට්ස් ලංකා (පුද්) සමාගම	25,600.00	25,600.00
රුසිරුමල් (පුද්) සමාගම	1,000.00	1,000.00
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	4,000.00	4,000.00
ටෙක්ස්වර්ඩ් ජර්සි (පුද්.) සමාගම	46,350.00	46,350.00
ට්‍රිග් ඇපරල් (පුද්) සමාගම	14,769.60	14,769.60
	7,491,012.80	**4,254,340.80**

2.3 බාහිර ණයගැනියන් සඳහා පුහුණුව

එලිගන්ට් නීටිං (පුද්.) සමාගම	-	159,120.00
කේන් ඇපරල්	10,200.00	10,200.00
ලංකා ගාමන්ට්ස් මැනුෆැක්චරිං ප්‍රයිවට් ලිමිටඩ්	7,500.00	7,500.00
පැටර්න් ගාමන්ට් (කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාවසාය)	12,500.00	12,500.00
ක්වින්ස් වරක්වෙයාර්	30,000.00	30,000.00
ෂාස් වෙයාර් (පුද්.) සමාගම	30,600.00	30,600.00
එස්ජීකිව් ඇපරල්	30,000.00	30,000.00
ශ්‍රී ලංකා යුධ හමුදා යන්ත්‍රෝපකරණ කර්මාන්තශාලාව	40,800.00	40,800.00
	161,600.00	**320,720.00**

2.4 ණයගැනීන් සඳහා උපදේශන සේවා

ක්‍රියේටිව් ටෙක්ස්ටයිල් මිල්ස් - උපදේශන	10,000.00	-
සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව	1,730.40	1,730.40
හයිඩ්‍රාමනී ඉන්ටර්නැෂනල් එක්ස්පෝර්ට්ස් පුද්. සමාගම	-	469,000.00
පත්මා ඩිස්ට්‍රිබියුටර්ස්	2,203.20	2,203.20
පොලිස් මූලස්ථානය	18,506.88	18,506.88
සිල්වර් මිල්ස් (පුද්.) සමාගම - පුහුණු	175,000.00	-
විශේෂ කාර්ය බලකාය - උපදේශන	22,505.28	22,505.28
ශ්‍රී ලංකා රේගුව	13,708.80	13,708.80
ශ්‍රී ලංකා නාවික හමුදාව	24,904.32	24,904.32
	268,558.88	**552,558.88**

2.5 පාරිභෝගික/ තාක්ෂණික සේවා ණයගැනියන්

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	-	23,920.00
නෝර්ඩෙක්ස් (පුද්) සමාගම	3,300.00	3,300.00
පොලිස් මූලස්ථානය	25,806.00	25,806.00
ශ්‍රී ලංකා ඇපරල්	17,650.00	17,650.00
ස්කැන්ස්කෝ ට්‍රේඩිං කම්පැනි (පුද්.) සමාගම	-	26,892.00
ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය	22,000.00	74,520.00
යසිදු ටෙක්ස්ටයිල්	23,800.00	-
වැන්ගාර්ඩ් ඉන්ඉස්ට්‍රීස් ලිමිටඩ්	-	27,000.00
	92,556.00	**199,088.00**

2.6 වෙනත් වෙළඳ ණයගැනියෝ

බෙයර්ෆුට් (පුද්.) සමාගම	2,500.00	2,500.00
ෆිඩෙලිටි මැනුෆැක්චරිං (පුද්) සමාගම	200.00	200.00
ෆෝර්ටි හෙල්ත්කෙයාර් (පුද්) සමාගම	3,240.00	3,240.00
මාස් කැපිටල් (පුද්) සමාගම	46,920.00	46,920.00
මාස් ඉන්ටිමේට්ස් (පුද්) සමාගම	82,516.86	82,516.86
මාස් කැප් ටීම්	800.00	800.00
අධ්‍යාපන අමාත්‍යාංශය	1,573,872.00	-
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය	-	618,531.11
ඔරිටන්ට්ස් ගාමන්ට්ස් සමාගම සෑම් ඩයිං	8,625.00	8,625.00
ශ්‍රී ලංකා ඇගළුම් අපනයනකරුවන්ගේ සංගමය	12,000.00	12,000.00
ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය	20,644.80	20,644.80
අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය	161,500.04	161,500.04
ටෙක්ස්ටර්ඩ් ජර්සි ලංකා (පුද්) සමාගම	3,300.00	3,300.00
යුනිවෙලා (පුද්) සමාගම - සායම් පොවන ලද සාම්පල	2,882.75	2,882.75
	1,919,001.45	**963,660.56**

2.7 **විවිධ ණයගැනියෝ**

කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය (PIP & SME)	-	8,332,684.00
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය - පර්යේෂණ සහ සංවර්ධන ඒකකය (කෙසෙල් කෙඳි)	-	2,631,728.31
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය- පාවහන්	-	6,616,350.00
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය- ඉගෙනුම් කළමනාකරණ පද්ධති සවිකිරීම	-	3,692,559.50
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය - පුස්තකාල ස්වයංක්‍රියකරණය	-	684,232.00
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය - තෙත් ක්‍රියාවලිය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය	-	1,250,000.00
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය - දිවියට උදාන -පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය	-	400,399.97
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය - සෞඛ්‍ය සහ ආරක්ෂණ ව්‍යාපෘතිය	-	3,654,495.37
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය - රෙදිපිළි පුස්තකාලය	-	1,917,835.00
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය - සිරුරේ මිමි ගැනීම	-	1,851,489.35
විවිධ අත්තිකාරම්	40,937.76	52,937.76
ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොළී	254,867.31	278,875.74
භාණ්ඩාගාර බිල්පත් සඳහා ලැබිය යුතු පොළී	39,858.34	58,525.57
ඇමතුම් තැන්පතු සඳහා ලැබිය යුතු පොළී	7,341,295.06	10,586,871.40
එල්කේ ඩොමෙයින් වෙත ලැබිය යුතු මුදල්	-	175.00
සුබසාධන සංගමය	258,333.16	399,999.82
ලංකා අශෝක් ලේලන්ඩ් පීඑල්සී	43,280.50	43,280.50
ලැබියයුතු වැට් බදු	98,230.71	98,230.71
	8,076,802.84	**42,550,670.00**

			2020	2019
3	**භාණ්ඩ තොග (හෙළිදරව්කිරීම් අංක 4)**			
	ලිපිද්‍රව්‍ය		1,090,185.33	1,039,644.18
	පුනුණු උපකරණ සහ පාරිභෝගික භාණ්ඩ		1,480,698.89	1,080,305.84
	සායම් සහ තුල්		225,431.00	314,475.85
	අමතර කොටස් සහ උපාංග		196,857.30	196,857.30
			2,993,172.52	**2,631,283.17**
4	**පෙර ගෙවුම්**			
	රක්ෂණය - වෛද්‍ය		214,784.70	219,029.23
	රක්ෂණය - මෝටර් වාහන		335,256.39	341,320.90
	රක්ෂණය - ගිනි සහ වෙනත්		121,288.55	123,681.66
	රක්ෂණය -මාරු කරනු ලබන මුදල්		9,479.29	15,443.66
	සේවා ගිවිසුම් - පරිගණක		96,871.25	53,724.95
	සේවා ගිවිසුම් - ගෘහභාණ්ඩ සහ උපකරණ		61,416.68	80,660.97
	සේවා ගිවිසුම් - විදුලි උත්පාදන යන්ත්‍ර		23,222.25	-
	සේවා ගිවිසුම් - විද්‍යාගාර උපකරණ		94,500.00	-
	වාහන බලපත්‍ර		-	20,248.66
	සැපයුම් - පරීක්ෂා රසායනාගාරයේ ප්‍රතිකාන ගාස්තු		34,013.54	68,027.18
	දායකත්ව ගාස්තු		-	822.72
	ඩිප්ලෝමා ප්‍රදාන උත්සවය		250,000.00	250,000.00
			1,240,832.65	**1,172,959.93**
5	**ප්‍රාග්ධන කාර්යයන් සඳහා කළින් ගෙවීම් කිරීම**			
	ගොඩනැගිලි ඉදිකිරීම්		3,762,600.68	3,762,600.68
	ආපනශාලාව අලුත්වැඩියාව		-	4,775,116.84
	සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම		-	13,565,043.46
			3,762,600.68	**22,102,760.98**
6	**වෙනත් ජංගම වත්කම්**			
	කාර්ය මණ්ඩල ණය	**6.1**	8,955,211.34	10,249,409.12
	තැන්පතු	**6.2**	421,000.00	406,000.00
			9,376,211.34	**10,655,409.12**
6.1	**කාර්ය මණ්ඩල ණය**			
	ආපදා ණය	**(6.1.1)**	8,955,211.34	10,246,909.12
	උත්සව අත්තිකාරම්	**(6.1.2)**	**-**	2,500.00
			8,955,211.34	**10,249,409.12**
6.1.1	**ආපදා ණය**			
	ඩී.එල්.විජේතුංග මහතා		72,916.78	125,000.08
	ඩබ්ලිව්.ඒ.සී.අශෝකා මිය		140,625.03	192,708.33
	ආර්.එම්.එන්.ඩී.රණසිංහ මිය		234,375.01	119,791.66
	ආර්.ඒ.ඩී.ආර්.අයි.පෙරේරා මහතා		229,166.68	197,916.67
	ජේ.ඒ. ප්‍රියන්ත මහතා		161,458.39	213,541.69
	ඩී.ඒ.එම් ප්‍රියංගිකා මිය		187,500.03	239,583.33
	ඩබ්ලිව්.එම්.ඩී.ඒ. වර්ණසූරිය මිය		197,916.70	250,000.00
	ජී.එස්.වඩුගේ මිය		197,916.70	250,000.00
	එස්.එල්.එස්. කරුණාරත්න මෙය		41,666.80	93,750.10
	ටී ආර්. ජයනිලක මිය		-	244,791.67
	ඊ.ඒ.ඩී.සුනීතා මිය		197,916.70	140,625.07
	පී.කේ.ආර්.එස්. ආරියරත්න මිය		119,791.75	171,875.05
	එල්.ටී.ඩී.හෙට්ටිආරච්චි මහතා		187,500.04	239,583.34
	එම්.ඩී.යූ ජයදාස මහතා		177,083.37	229,166.67
	ජේ.පී.ඩී.ආර්. විජේවර්ධන මහතා		45,000.00	95,000.00
	ඩී.එන්. දොඩංගොඩ මිය		208,333.36	119,791.75
	ආර්.ඒ.ඩී.ටී.ආර් සමරනායක මිය		140,625.03	192,708.33
	ජී.එස්.රංජනී මිය		218,750.02	166,213.33
	ඩී.ඒ.ඩී.එස්.කණ්ඩම්බි මිය		250,000.00	119,791.75

	2020	2019
ටී. බාලචන්ද්‍ර මිය	177,083.37	229,166.67
ජේ.එම්.ඒ.එස්.ඒ. ජයකොඩි මහතා	213,541.69	24,999.86
ජේ.එම්.ඩී.ආර්.ආර්. ජයසේකර මිය	145,833.37	197,916.67
පී.ඩී.ආර්.ආර්. ද සිල්වා මිය	223,958.35	125,000.08
බී.එස්.ඒ. මෙන්ඩිස්මිය	131,944.52	201,388.92
ඩබලිව්.එම්.එස්.කේ. විජේබාහු මහතා	67,708.45	125,000.08
වයි.එන්.වික්‍රමනායක මහතා	218,750.02	171,875.05
කේ.ඒ.එම්. ප්‍රියන්ත මහතා	159,722.28	229,166.68
යූ.වික්‍රමසිංහ මහතා	67,708.45	119,791.75
එන්.පී.පී.එස්.කේ පතිරණ මහතා	48,611.24	118,055.64
එච්.ටී.එම්.ඩී. දිනේෂා මිය	177,083.37	229,166.67
එස්.පී.ඒ.සත්‍යාපාල මහතා	34,722.36	104,166.76
එම්.එස්.ආර්.භානු මිය	192,708.37	244,791.67
එස්. තෙවරප්පෙරුම මිය	156,250.06	208,333.36
ආර්.එම්.යූ.රත්නායක මහතා	250,000.00	119,791.75
ඩී.පී.විරරත්න මහතා	67,708.45	119,791.75
අමාලි චතුරිකා මිය	41,666.54	83,333.24
වයි.එම්.ද සිල්වා මිය	192,708.37	244,791.67
ඩබලිව්.ඩී.නිරෝෂා මිය	223,958.35	54,166.55
එන්.කේ.මනොරා හද්‍රානි මිය	208,333.36	41,666.60
එන්.සී.රණසිංහ මිය	52,083.46	104,166.76
ජේ.එම්.ඩී. ජයලත් මහතා	98,958.43	151,041.73
එම්.ඩී.එල් ප්‍රනාන්දු මහතා	55,555.51	111,111.11
එම්.එන්.රණසිංහ මිය	-	145,833.40
ඩබලිව්.ඒ.එල්.එන්.කුමාර මහතා	187,500.04	239,583.34
ජී.කේ.කේ.එස්.කුමාර මහතා	52,083.46	104,166.76
එල්.අයි.කාරියවසම් මිය	98,958.43	151,041.73
කේ.ඒ.පී ප්‍රනාන්දු මහතා	36,458.47	88,541.77
ඒ.එච්. හිඟුස් මහතා	182,291.70	234,375.00
එන්.ඒ.සී.කේ. තිරිමාවිතාන මිය	131,944.52	201,388.92
වයි.ඒ.පී.ජී.යාපා මිය	187,500.23	250,000.00
පී.ඩී.මධුවන්ති මිය	171,875.03	223,958.33
පී.ඒ. බුද්ධිකා මිය	-	79,166.57
එම්.එම්.මීප්‍රාස් මිය	182,291.71	234,375.01
එන්.එම්.එම්.රිහාන් මහතා	156,666.72	205,625.02
පී.වී.එස් විජයරත්න මහතා	62,500.12	125,000.08
එස්. වතුදුර මිය	171,875.03	223,958.33
එන්.එම්.සබීර් මහතා	218,750.02	79,166.67
ඩී.එල්. කුෂ්ලානි මිය	182,291.70	234,375.00
සී.සී.එස්.සිල්වා මහතා	165,000.04	210,833.34
එන්.පී.කේ.රාජපක්ෂ මහතා	187,500.04	239,583.34
එම්.ආර්.එස්.කේ.මංවනායක මහතා	145,833.30	-
එන්.අයි.එස්.සිල්වා මිය	218,750.02	-
අයි.එස්.ජයලත්ගේ මහතා	-	215,416.67
	8,955,211.34	**10,246,909.12**

6.1.2 උත්සව අත්තිකාරම්

ඒම්.එම්.එම්.සබීර් මහතා	-	1,250.00
රමීෂා භානු මිය	-	1,250.00
	-	**2,500.00**

6.2 තැන්පතු

ලංවිම තැන්පතු	250,000.00	250,000.00
ආර්.එෆ්.එල්. පුනාන්දු - තැන්පතු	100,000.00	100,000.00
ඔක්සිජන් සහ අවක්‍රීය සිලින්ඩර	36,000.00	36,000.00
ඩයලොග් ටෙලිකොම් සමාගම් රෝපීං පහසුකම	20,000.00	20,000.00
තැපැල් සේවා තැන්පතුව	15,000.00	-
	421,000.00	**406,000.00**

7. යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ

	පිරියත සහ යන්ත්‍ර	මෝටර් වාහන	කාර්මික මැහුම් යන්ත්‍ර	ගෘහඋපකරණ, සවිකිරීම් සහ උපකරණ	විද්‍යාගාර උපකරණ	පරිගණක	පොත් සහ සහරා	වීඩියෝ වැඩසටහන	අමතර කොටස් ගිණුම	මුළු මුදල
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය										
2020/01/01 දිනට පිරිවැය	**55,571,942.41**	**24,248,384.33**	**47,355,993.22**	**69,472,692.76**	**181,584,041.68**	**44,633,881.62**	**9,520,888.89**	**582,055.00**	**1,356,195.00**	**434,326,074.91**
එකතුකිරීම් සටහන් අංක.7.1	4,773,381.82	-	2,635,200.00	9,561,289.04	2,237,112.00	362,910.00	-	-	-	**19,569,892.86**
බැහැරකිරීම්	(682,997.43)			(437,579.08)	-	(793,147.98)				**(1,913,724.49)**
2020/12/31 දිනට පිරිවැය	**59,662,326.80**	**24,248,384.33**	**49,991,193.22**	**78,596,402.72**	**183,821,153.68**	**44,203,643.64**	**9,520,888.89**	**582,055.00**	**1,356,195.00**	**451,982,243.28**
සමුච්චිත ක්ෂය										
2020/01/01 දිනට සමුච්චිත ක්ෂය	**37,548,038.18**	**19,356,576.94**	**41,057,499.42**	**48,779,223.63**	**139,903,192.55**	**36,473,923.84**	**6,742,205.37**	**582,055.00**	**1,356,195.00**	**331,798,909.93**
පොත්වල සහ වාර සහරාවල දෝෂ නිවැරදි කිරීම්	**-**	**-**	**-**	**-**	**-**	**-**	146,441.25	**-**	**-**	**146,441.25**
වර්ෂය සඳහා ක්ෂය කිරීම්	3,094,578.75	2,056,824.11	1,630,417.73	5,671,547.77	7,946,583.80	2,508,077.00	378,412.48	-	-	**23,286,441.64**
බැහැර කරන ලද වත්කම් ක්ෂයකිරීම්	(621,435.93)	-		(406,576.12)	-	(793,147.98)	-	-	-	**(1,821,160.03)**
2020/12/31 දිනට සමුච්චිත ක්ෂය	**40,021,181.00**	**21,413,401.05**	**42,687,917.15**	**54,044,195.28**	**147,849,776.35**	**38,188,852.86**	**7,267,059.10**	**582,055.00**	**1,356,195.00**	**353,410,632.79**
2020/12/31 දිනට ශුද්ධ පොත් අගය	**19,641,145.80**	**2,834,983.28**	**7,303,276.07**	**24,552,207.44**	**35,971,377.33**	**6,014,790.78**	**2,253,829.79**	**-**	**-**	**98,571,610.49**

7.1 **යටිතල පහසුකම් පිරියත සහ උපකරණ**

දේපළ, පිරියත සහ උපකරණ - එකතුකිරීම්

		2020
පිරියත සහ යන්ත්‍ර		
සම්මන්ත්‍රණ ශාලාව අලුත්වැඩියා කිරීම -VRF ඒකකය		2,010,749.00
සම්මන්ත්‍රණ ශාලාව අලුත්වැඩියා කිරීම - වායු සමීකරණ යන්ත්‍රය (ටොෂිබා)		1,144,896.00
සම්මන්ත්‍රණ ශාලාව අලුත්වැඩියාව කිරීම - ශීතක පයිප්පය		292,730.00
සම්මන්ත්‍රණ ශාලාව අලුත්වැඩියා කිරීම - ජලය බැසයාමේ පයිප්පය		40,360.00
සම්මන්ත්‍රණ ශාලාව අලුත්වැඩියා කිරීම - විදයුත් පාලක වයරය		12,613.00
සම්මන්ත්‍රණ ශාලාව අලුත්වැඩියා කිරීම -VCD නම්‍යශීලී නළය		6,054.00
වායු සමීකරණ යන්ත්‍ර (පැනසොනික්)		1,028,160.00
සවිකිරීම ගාස්තු		169,299.81
වායු සමීකරණ යන්ත්‍රය (අබාන්ස් LG)		68,520.01
		4,773,381.82
ගෘහ භාණ්ඩ, වැද්දුම්, සවි කිරීම සහ උපකරණ		
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - සිවිලිං විදුලි පංකාව	1	18,548.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - ශබ්ද පද්ධතිය	1	275,091.92
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම- බහුමාධ්‍ය පද්ධතිය	1	422,015.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - ශබ්ද පාලක පැනලය සහිත පෙට්ටිය	1	116,231.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - බෙදාහැරීම් පුවරුව	1	92,737.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - වේදිකාව (පෝඩියම්)	1	231,225.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම- ප්‍රධාන ආසනය	1	60,589.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම- දේශන සඳහා හවිතා කරන මේසය	1	165,690.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - දේශන සඳහා භාවිතා කරන පුටුව	1	23,000.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - දේශන සඳහා භාවිතා කරන පුටුව	1	259,664.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - පිටුපස උස අඩු පුටුව	2	30,400.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - පිළිගැනීමේ මේසය	1	161,981.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - ආසන තුනක් සහිත සෝෆාව	1	68,000.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම- කෝපි මේසය	1	69,244.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - එක්ස්ප්‍රස් ලක් ස්මාර්ට බෝඩ් 75	1	622,643.16
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - ශිෂ්‍ය මේස (1'-9'x4'-0')	25	840,799.92
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - ශිෂ්‍ය මේස (1'-9'x2'-0')	12	210,200.04
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම - ශිෂ්‍ය පුටු	60	1,168,500.00
මළ නොබඳින වානේ ලාංඡනය -SLITA	1	9,500.00
පිටුපස උස අඩු විධායක පුටුව	2	24,570.00
සිරුරේ බර මනින තරාදිය	1	2,250.00
CCTV පද්ධතිය සහ විදුලි කේබල්	1	1,511,320.00
4.5' t කොන්ක්‍රීට් කණුව	1	7,500.00
කාර්යාල රාක්කය	1	19,950.00
ආපනශාලාව අළුත්වැඩියා කිරීම - ආසන 4 කැම මේස (වානේ රාමුව සහ පර්ස්ටොප් මතුපිට)	16	924,400.00
ආපනශාලාව අළුත්වැඩියා කිරීම - ආසන 6 කැම මේසය (වානේ රාමුව සහ පර්ස්ටොප් මතුපිට)	3	252,540.00
ආපනශාලාව අළුත්වැඩියා කිරීම - කැම මේසයේ පුටුව	82	845,420.00
ආපනශාලාව අළුත්වැඩියා කිරීම - කාර්ය පුටුව/ආපනශාලා පුටුව	2	38,360.00
ආපනශාලාව අළුත්වැඩියා කිරීම - මුදල් අයකැමි කවුළුව	1	80,145.00
ආපනශාලාව අළුත්වැඩියා කිරීම - ප්‍රදර්ශන කැබිනෙට්ටුව	3	630,000.00
ආපනශාලාව අළුත්වැඩියා කිරීම - ආහාර කවුළුව (6'-0'X2'-0'X5'-0')	1	200,000.00
ආපනශාලාව අළුත්වැඩියා කිරීම - කපන මෙසය (මිමි3000x600x1200)	1	87,600.00
ආපනශාලාව අළුත්වැඩියා කිරීම - මුළුතැන්ගේ මෙසය (මිමි 1980x600x1200)	1	48,240.00
ආපනශාලාව අළුත්වැඩියා කිරීම - (මිමි 670x600x1200)	1	22,200.00
ආපනශාලාව අළුත්වැඩියා කිරීම - උදුන් විමිනිය (අබාන්ස් එල්බා)	1	20,735.00
		9,561,289.04

පරිගණක		2020
ප්‍රොලින්ක් PRO701SFC යූඑසබී (අනුක්‍රමික අංකය.554701194603284)	1	4,260.00
කැනන් LBP 214DW මුද්‍රණ යන්ත්‍රය (අනුක්‍රමික අංකය. එන්කේLA027451)	1	24,000.00
මෘදුකාංග සහ දෘඩාංග සහ ජීපීආර්එස් (කේආර්-1116,පීඊ-1716,එන්බී-3111,කේකිව්-0970,පීඊ-8714)	1	87,500.00
ට්‍රාන්සෙන්ඩ් 1TB එක්ස්ටර්නල් හාර්ඩ් ඩිස්ක් ඩ්‍රයිව්	1	10,550.00
Seagate 2TB එක්ස්ටර්නල් හාර්ඩ් ඩිස්ක් ඩ්‍රයිව්	1	14,850.00
මෘදුකාංග සහ දෘඩාංග සහ ජීපීආර්එස් - (300-3750,CAD-1577)	1	35,000.00
ලැප්ටොප් පරිගණකය (HP)	1	165,750.00
යූඑසබීප්‍රොලින්ක් ප්‍රෝ 700 (අනු අංකය.564801200603805)	1	5,150.00
ට්‍රාන්සෙන්ඩ් 2ටීබී එක්ස්ටර්නල් හාර්ඩ් ඩිස්ක් ඩ්‍රයිව්	1	15,850.00
		362,910.00

කාර්මික මහන මැෂිම

කාර්මික තනි ඉදිකටුව සහිත Lockstich මහන මැෂිම (ජුකි වර්ගය)-(පූර්ණ ඩිජිටල්)		
අනු අංකය .8DOKJ04783	1	231,120.00
අනු අංකය.8DOKJ04768	1	231,120.00
අනු අංකය.8DONL01975	1	231,120.00
අනු අංකය.8DONLO1945	1	231,120.00
අනු අංකය.8DONLO1975	1	231,120.00
ඉදිකටු 04 ෆිඩ් ඕෆ් ද ආර්ම්,ෆ්ලැට් සීමර්ස්,ටොප් බොටම් කවර්	1	1,479,600.00
		2,635,200.00

රසායනාගාර උපකරණ

රොටරි වාෂ්පීකරණ යන්ත්‍රය (මොඩල් ආර්වී 10 ඩිජිටල් වී)	1	1,376,244.00
රෙසිප්‍රොකේටිං ෂේකර්	1	620,676.00
යුනිවර්සල් සෙන්ට්‍රිෆියුජ්	1	240,192.00
		2,237,112.00

8. 2020/12/31 දිනට ඉඩම් සහ ගොඩනැඟිලි

	ඉඩම්	ගොඩනැඟිලි	මුළු මුදල
	රු. '000	රු. '000	රු.'000
පිරිවැය			
2020/01/01 දිනට පිරිවැය	5,018,434.00	79,393,843.00	84,412,277.00
එකතුකිරීම් - සටහන් අංක .8 . 1	-	16,843,189.24	16,843,189.24
2020/12/31 දිනට පිරිවැය	**5,018,434.00**	**96,237,032.24**	**101,255,466.24**
සමුච්චිත ක්ෂය			
2020/01/01 දිනට සමුච්චිත ක්ෂය		37,166,764.79	37,166,764.79
වර්ෂය සඳහා ක්ෂය	-	2,350,593.41	2,350,593.41
20200/12/31 දිනට සමුච්චිත ක්ෂය	**-**	**39,517,358.20**	**39,517,358.20**
2020/12/31 දිනට ශුද්ධ පොත් අගය	**5,018,434.00**	**56,719,674.04**	**61,738,108.04**

8.1 ඉඩම් සහ ගොඩනැඟිලි

ගොඩනැඟිලි	2020	2019
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම	6,956,691.62	
ඇස්ෆල්ට් කොන්ක්‍රීට් එලීම + 10% රැඳවුම් මුදල	1,826,897.70	
වැසිකිළි රැඳවුම් මුදල	56,420.38	
ආපනශාලාව අළුත්වැඩියා කිරීම	8,003,179.54	
	16,843,189.24	

9	**ගෙවිය යුතු මුදල්**			
	වෙළඳ ණයගැතියෝ	**9.1**	1,228,401.38	862,926.38
	සමුච්චිත වියදම්	**9.2**	8,109,729.78	6,343,636.75
	විවිධ ණයගැතියෝ	**9.3**	4,541,415.25	4,392,815.25
	ගෙවියයුතු ජංගම බදු	**9.4**	7,625.00	27,177.50
	ගෙවිය යුතු ව්‍යාපෘති 2019	**9.5**	920,000.00	5,265,504.48
			14,807,171.41	16,892,060.36

9.1 වෙළඳ ණයගැතියෝ

කළින් ලද පාඨමාලා ගාස්තු	1,228,401.38	862,926.38
	1,228,401.38	862,926.38

9.2 සමුච්චිත වියදම් - උපචිත වියදම්

පුහුණුවන්නන් සඳහා අනියම් වේතන සහ දීමනා	193,746.98	37,006.40
TEC & MTB සාමාජිකයන් සඳහා දීමනා	86,000.00	80,000.00
ගොඩනැඟිලි පිරිවැය	182,689.76	-
2020 ව්‍යාපෘතිය -බතික් පුහුණු වැඩසටහන	442,642.57	-
20/21 ව්‍යාපෘතිය- ඇගළුම් සහ පේෂකර්ම කර්මාන්තයේ පර්යේෂණ සහ සංඛ්‍යාන ක්‍රියාකාරකම්		-
ශක්තිමත් කිරීම මී.3.0	31,495.00	
පාසල් නිලඇඳුම් පරීක්ෂා කිරීම	517,825.44	-
සම්බන්ධීකරණ ගාස්තු	457,418.00	6,591.00
ප්‍රවාහන	281,254.83	376,551.52
තේ වියදම්	2,305.00	-
සභාපතිවරුන් සඳහා දීමනා	-	37,500.00
පරිගණක අළුත්වැඩියාව සහ නඩත්තුව	12,420.00	49,409.02
මෝටර් වාහන අළුත්වැඩියාව සහ නඩත්තුව	-	93,300.00
විදුලි උත්පාදක යන්ත්‍ර අළුත්වැඩියාව සහ නඩත්තුව	237,050.00	-
F.F.F සහ උපකරණ අළුත්වැඩියාව සහ නඩත්තුව	2,700.00	-
පිරියත සහ යන්ත්‍ර අළුත්වැඩියාව සහ නඩත්තුව	102,737.16	231,261.29
ඉඩම් සහ ගොඩනැඟිලි අළුත්වැඩියාව සහ නඩත්තුව	14,731.20	15,960.00
උපාධි ප්‍රදාන තත්ත්වය ලබාගැනීම සඳහා වන වියදම්	-	76,000.00
අතිකාල දීමනා	294,676.18	295,516.87
ගමන් සහ යැපීම් දීමනා	74,250.00	124,800.00
ජලය	9,583.87	17,641.65
විදුලිය	146,505.10	862,396.93
ආරක්ෂක ගාස්තු	-	136,600.00
වෙළඳ දැන්වීම් ගාස්තු	184,242.60	-
සන්නිවේදන දීමනා	67,732.39	124,677.87
වාහන සහ විදුලි උත්පාදක යන්ත්‍ර සඳහා ඉන්ධන	-	180,128.50
ශ්‍රමික සුබසාධනය සඳහා වෛද්‍ය පහසුකම් යෝජනා ක්‍රමය	140,324.63	248,981.12
සනීපාරක්ෂක සේවා	-	362,350.80
ගෝස් පරීක්ෂාකිරීමේ වියදම්	-	24,000.00
පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීම	-	101,693.35
ආරාධිත දේශක ගාස්තු	143,700.00	311,122.40
පුවත්පත් බිල්පත්	2,500.00	2,780.00
ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම	516,151.60	182,864.31
ඵලදායීතා සංවර්ධන දෙපාර්තමේන්තුව	-	177,078.13
සති අන්ත ගෙවීම්	717,394.17	1,159,931.35
පුහුණු පාඨමාලා සඳහා වියදම්	-	93,505.00
වෙනත් සේවා ගාස්තු	-	18,690.00
කෙසෙල් කෙඳි සංර්ධනය කිරීම	-	10,297.00
සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම	681,526.73	43,901.15
ආපනශාලාව අලුත්වැඩියා කිරීම	2,520,208.56	-
උපදේශක දිරිදීමනා	-	367,580.00
ESC	-	195,443.00
ශිෂ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම	-	283,755.67
වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන	18,379.95	14,322.42
ප්‍රතිනන සහ සහතිකකරණ ගාස්තු	27,538.06	-
	8,109,729.78	**6,343,636.75**

9.3	**විවිධ ණයගැතියෝ**			
	උපදේශන අත්තිකාරම්		11,536.25	14,836.25
	කළින් නිකුත්කළ පරීක්ෂණ වාර්තා		19,430.86	18,530.86
	ආපනශාලා ටෙන්ඩරය සඳහා තැන්පතුව		5,000.00	5,000.00
	ලංසු සඳහා ඇප තැන්පතු		6,000.00	67,000.00
	ආපසු ගෙවියයුතු තැන්පතු		495,000.00	345,000.00
	මහා භාණ්ඩාගාරය (වාහන විකුණුම් ක්‍රියාවලිය)		3,871,448.14	3,871,448.14
	ආපසු ගෙවිය යුතු යෙන්ඩර් තැන්පතු		133,000.00	71,000.00
			4,541,415.25	**4,392,815.25**
9.4	**ගෙවියයුතු බදු**			
	ගෙවියයුතු මුද්දර බදු ගිණුම		7,625.00	9,025.00
	ගෙවිය යුතු වැට් බදු		-	-
	ගෙවියයුතු රැඳවුම් බදු ගිණුම		-	18,152.50
	ගෙවිය යුතු ජාතිය ගොඩනැඟීමේ බදු		-	-
			7,625.00	**27,177.50**
9.5	**2019 ව්‍යාපෘති සඳහා ගෙවියයුතු මුදල්**			
	රෙදිපිළි පුස්තකාල ව්‍යාපෘතිය		-	700,000.00
	සෞඛ්‍ය සහ ආරක්ෂණ ව්‍යාපෘතිය		-	2,931,400.00
	ඉගෙනුම් කළමනාකරණ ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම		920,000.00	920,000.00
	පුස්තකාල ස්වයංක්‍රියකරණ ව්‍යාපෘතිය		-	165,750.00
	ඵලදායීතා වර්ධන වැඩසටහන		-	548,354.48
			920,000.00	**5,265,504.48**
10	**කෙටිකාලීන වෙන්කිරීම්**			
	විගණන ගාස්තු සඳහා වෙන්කිරීම්		2,000,000.00	1,000,000.00
	කාර්යමණ්ඩල සංවර්ධන අරමුදල සඳහා වෙන්කිරීම්		984,899.66	803,294.66
			2,984,899.66	**1,803,294.66**
11	**විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම්**			
	පාරිතෝෂික සඳහා වෙන්කිරීම් (හෙළදරවිකිරීම් අංක 6)			
	වර්ෂය ආරම්භයේදී ශේෂය		43,911,043.50	38,005,998.00
	අඩුකළා - වර්ෂය සඳහා ගෙවීම්		(1,538,460.00)	(1,928,809.50)
			42,372,583.50	36,077,188.50
	වර්ෂය සඳහා වෙන්කිරීම්		8,584,374.00	7,833,855.00
	වර්ෂය අවසානයේදී ශේෂය		**50,956,957.50**	**43,911,043.50**
12	**රජයේ දායකත්වය සහ විදෙස් ආධාර (හෙලිදරවිකිරීම් අංක 7)**			
	වර්ෂය ආරම්භයේදී ශේෂය		161,932,729.47	162,061,320.65
	එකතුකළා - වර්ෂය සඳහා ප්‍රදාන	**12.1**	2,402,862.00	22,887,134.45
			164,335,591.47	184,948,455.10
	අඩුකළා - වර්ෂය සඳහා ක්‍රමක්ෂයවීම්	**12.2**	(23,110,220.99)	(23,015,725.63)
	වර්ෂය අවසානයේදී ශේෂය	**12.3**	141,225,370.48	**161,932,729.47**
12.1	**ප්‍රාග්ධන ප්‍රදාන**			
	වර්ෂය තුළ මුදල් ප්‍රදාන		-	3,857,000.00
	ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශය මඟින් ලද රජයේ ප්‍රදාන	**12.1.1.**	2,402,862.00	19,030,134.45
			2,402,862.00	**22,887,134.45**
12.1.1	**ප්‍රාග්ධන ව්‍යදම් සඳහා ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශය මඟින් ලද රජයේ ප්‍රදාන**			
	සෞඛ්‍ය හා ආරක්ෂණය		2,237,112.00	**-**
	පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය		-	96,212.50
	රෙදිපිළි පුස්තකාලය		-	1,641,276.00
	කෙසෙල් කෙඳි ව්‍යාපෘතිය		-	12,256,482.95
	පුස්තකාල ස්වයංක්‍රියකරණය		165,750.00	2,505,813.07
	ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය		-	2,313,103.50
	වැරදි නිවැරදිකිරීම්		-	43,996.43
	ජේශ ක්‍රර්ම නිමහම් කර්මාන්ත හරිතකරණ වැඩ සටහන		-	173,250.00
			2,402,862.00	19,030,134.45
12.2	**වර්ෂය සඳහා ක්‍රමක්ෂයවීම්**			
	රජයේ ප්‍රදාන මඟින් ක්ෂය කරන ලද වත්කම් කොටස		23,110,220.99	23,015,725.63
			23,110,220.99	**23,015,725.63**

			2020	2019
12.3	**රජයේ දායකත්වයන් සහ විදේශීය ප්‍රදාන**			
	රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		475,707,177.63	473,304,315.63
	අමාත්‍යාංශය විසින් මාරු කරන ලද වත්කම්		50,043,791.00	50,043,791.00
	විදේශ ආධාර (ලෝක බැංකු සහ ජපන් සහයෝගීත්ව සංවිධානය		99,276,267.00	99,276,267.00
	ලද වෙනත් අධාර		291,081.00	291,081.00
			625,318,316.63	622,915,454.63
	අඩු කළා - සමුච්චිත මුලු ක්‍රමක්ෂය මුදල		(484,092,946.15)	(460,982,725.16)
			141,225,370.48	**161,932,729.47**
13	**වෙනත් ව්‍යාපෘති**			
	අත්‍යන්ත්‍ර රෙදිපිළි සංවර්ධන වැඩසටහන - මරදමුනෙයි		2,147,985.53	2,147,985.53
	කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශයේ ශිෂ්‍යත්ව අරමුදල		236,867.04	236,867.04
	2020 ව්‍යාපෘතිය - බහික් පුහුණු වැඩසටහන		5,280,358.93	-
	20/21 ව්‍යාපෘතිය -Eet.Tex.Des.Inno.& Res.Dev-Mn.7.1		6,986,114.00	-
	20/21 ව්‍යාපෘතිය -Stren.the Res.& Sta.Act.-Mn.3		2,680,512.19	-
	මැහුම් ගොඩනැඟිල්ල අලුත්වැඩියා කිරීම සහ පන්ති කාමර වැඩිදියුණු කිරීම		9,732,762.00	-
	ඇගලුම් පදනම් කරගත් ගෘහ කර්මාන්තය		229,219.06	355,219.06
			27,293,818.75	**2,740,071.63**
14	**සමුච්චිත අතිරික්ත/හිඟ**			
	ඉදිරියට ගෙනා ලාභය		275,379,901.79	260,570,886.86
	<u>ශේෂ පතුයේ දිනට පසු සිදුවූ අවස්ථා සඳහා පූර්ව වර්ෂයේ ගැලපුම්</u>			
	ආපසු ගෙවන ලද පාඩමාලා ගාස්තු		-	-
	සංශෝධිත වියදම්	**14.1**	(290,405.34)	(2,562,263.94)
	මහන මැෂින් ව්‍යාපෘතිය		-	(644,000.00)
	විදේශ විනිමය / අලාභ		-	(1,017.72)
	සෞඛ්‍ය සහ ආරක්ෂණ ව්‍යාපෘතිය		-	(1,328,893.56)
			275,089,496.45	256,034,711.64
	වර්ෂය සඳහා අතිරික්තය		1,455,408.22	19,345,190.15
			276,544,904.67	**275,379,901.79**

14.1 සංශෝධිත වියදම්

සභාපතිවරයාගේ රියදුරු සඳහා දීමනා	7,206.60
අවලංගු කළ ගෙවීම්	(26,750.00)
ආරාධිත දේශක ගාස්තු	(1,000.00)
කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ව්‍යාපෘතිය 2019	5,100.00
පුස්තකාල ස්වයංක්‍රියකරණ ව්‍යාපෘතිය 2019	0.20
අතිකාල ගෙවීම්	16,657.29
පුහුණු වන්නන් සඳහා දීමනා	2,250.00
පොත් ක්ෂයවීම් ගිණුම	146,441.25
පාවහන් ව්‍යාපෘතිය	140,500.00
	290,405.34

15	**මෙහෙයුම් ආදායම**			
	පරීක්ෂා කිරීම	**(15.1)**	67,536,544.16	47,345,997.92
	පුහුණු කිරීම්	**(15.2)**	43,648,476.15	87,246,445.00
	උපදේශන සේවා	**(15.3)**	946,790.00	9,440,076.47
	පාරිභෝගික/ තාක්ෂණික සේවා සහ වෙනත් විකුණුම්		28,263,789.64	8,791,322.13
	පුල්මුඩේ සායම් කිරීමේ මධ්‍යස්ථානයේ නූල් විකිණීමෙන් ලද ලාභය	**(15.4)**	-	(598,399.39)
	වෙනත් ආදායම	**(15.5)**	21,779,448.06	30,642,923.14
	වත්කම් බැහැරකිරීම් වලින් ලද අතිරික්ත මුදල	**(15.6)**	-	54,635.00
			162,175,048.01	**182,923,000.27**
15.1	**පරීක්ෂාකිරීම්**			
	සාමාන්‍ය පරීක්ෂා කිරීම්		28,415,639.20	36,176,657.56
	හමුදා නිලඇඳුම්		23,589,527.27	11,170,743.88
	පාසැල් නිලඇඳුම් පරීක්ෂාකිරීම්		15,539,902.69	-
	අඩුකළා - ලබාදෙන වට්ටම් - පරීක්ෂාකිරීම්		(8,525.00)	(1,403.52)
			67,536,544.16	**47,345,997.92**
15.2	**පුහුණුකිරීම්**			
	සති පුහුණු		12,696,136.15	24,786,533.63
	සති අන්ත පුහුණු		27,072,580.00	43,328,780.00
	බාහිර පුහුණු		3,879,760.00	16,605,059.37
	කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය පුහුණුව		-	2,526,072.00
			43,648,476.15	**87,246,445.00**
15.3	**උපදේශන සේවා**			
	උපදේශන සේවා ආදායම		946,790.00	7,053,776.47
	එකතු කළා - උපදේශනය මඟින් ඵලදායීතා සංවර්ධන වැඩසටහනනේ ආයතනික කොටස			
	රජයෙන් ලද අරමුදල්		-	6,818,000.00
	කම්හල් වලින් ලද		-	300,000.00
			946,790.00	7,118,000.00
	අඩු කළා - ඉදිරි වර්ෂය සඳහා ඉදිරියට ගෙන ගියා		-	548,354.48
			946,790.00	6,569,645.52
	අඩුකළා - වියදම			
	වියදම		-	193,351.80
	වෙළඳ දැන්වීම්		-	120,981.28
	සංග්‍රහ වියදම්		-	14,362.00
	W/E,අතිකාල දීමනා, බදු		-	993,901.72
	දුරකථන බිල්පත්		-	5,767.45
	දුරකථන වියදම්		-	30,000.00
	ප්‍රවාහන		-	853,371.76
	වැටුප්, සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් සහ වෙනත් දීමනා		-	1,691,188.37
	ලිපිද්‍රව්‍ය		-	66,895.00
	නවාතැන්		-	146,500.00
	ගොඩනැඟිලි අළුත්වැඩියාව සහ නඩත්තුව		-	32,500.00
	පිරියත සහ යන්ත්‍ර අලුත්වැඩියාව සහ නඩත්තුව		-	6,307.34
	වෙනත්		-	28,218.80
	අඩු කළා - මුළු වියදම		-	4,183,345.52
	ඵලදායීතා වර්ධන වැඩසටහන වෙතින් ලද ආයතනික කොටස		-	**2,386,300.00**
	මුළු උපදේශන සේවා ආදායම		946,790.00	**9,440,076.47**

			2020	2019
15.4	පාලමුනෙයි සායම් මධ්‍යස්ථානයේ නූල් අලෙවියෙන් ලද ලාභය (හෙළිදරවිකිරීම් අංක **21**)			
	ආදායම			
	Sනූල් අලෙවිකිරීම්		-	9,750.00
	පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූර්ණය කිරීම		-	69,246.72
	අඩු කළා - වියදම්			
	භාවිතා කරන ලද අමුද්‍රව්‍ය	**15.4.1**	-	100,429.52
	විදුලි ගාස්තු		-	15,928.77
	භෞතික තහවුරු කිරීම්		-	58,002.33
	ජල බිල්පත්		-	2,129.23
	භාරදීමේ උත්සවය		-	59,775.00
	වැටුප් හා වේතන		-	441,131.26
	මුළු වියදම		-	**677,396.11**
	ලාභය/ (අලාභය)		-	**(598,399.39)**
15.4.1	වර්ෂය තුළ			
	භාවිතා කරන ලද අමුද්‍රව්‍ය			
	ආරම්භක තොගය			
	සායම් සහ රසායනික ද්‍රව්‍ය		-	121,261.62
	නූල්		-	293,643.75
			-	**414,905.37**
	එකතු කළා - වර්ෂය තුළ මිලදීගැනීම්			**-**
			-	**414,905.37**
	අඩු කළා - අවසන් තොගය			
	සායම් සහ රසායනික ද්‍රව්‍ය		-	125,365.85
	නූල්		-	189,110.00
			-	**314,475.85**
	උපයෝගී කළ මුදල		-	**100,429.52**
15.5	වෙනත් ආදායම්			
	වෙනත් අලෙවි ආදායම්	**(15.5.1)**	32,400.00	666,193.24
	විවිධ ආදායම්	**(15.5.2)**	274,787.00	2,171,942.06
	ඉතිරිකිරීම් ගිනුමේ පොළිය		9,594.11	9,624.20
	ස්ථාවර තැන්පතු පොළිය		430,004.33	439,458.69
	භාණ්ඩාගාර තැන්පතු පොළිය		976,133.85	1,255,039.49
	ඇමතුම් තැන්පතු පොළිය		18,913,765.72	25,013,439.12
	කාර්ය මණ්ඩල ණය පොළිය		602,923.27	625,476.34
	සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම්		106,000.00	-
	ආපනශාලා කුලිය		12,500.00	48,250.00
	ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතුව		119,000.00	413,500.00
	විදෙස් මුදල් හුවමාරු ලැබීම්		302,339.78	-
			21,779,448.06	**30,642,923.14**
15.5.1	වෙනත් විකුණුම් ආදායම			
	ශ්‍රවණාගාරය, සම්මන්ත්‍රණ ශාලාව, පන්ති කාමර කුලී ගාස්තු		32,400.00	135,900.00
	ශිෂ්‍යයන් සඳහා සපයන ලද පහසුකම්		-	530,293.24
			32,400.00	**666,193.24**

15.5.2 විවිධ ආදායම්	2020	2019
පොල්/තැබීලි අලෙවිකිරීම		-
ඡායා පිටපත් ගාස්තු	23,869.50	34,362.00
විභාග සඳහා නැවත පෙනී සිටීමේ ගාස්තු සහ වයිවා (VIVA) පරීක්ෂණ	52,000.00	49,500.00
ප්‍රවාහන ගාස්තු (PIP සහ දිවිනැගුම , වෙනත් ව්‍යාපෘති)	144,414.24	601,422.07
ණයගැතියන් වැඩිපුර ගෙවීම්	19,379.00	3,450.12
ටී-ෂර්ට් අලෙවිය	14,834.70	-
බැහැරකළ භාණ්ඩ අලෙවිය	-	38,390.00
දිනපොත් අලෙවිය	10,289.56	200.00
ව්‍යාපෘති සඳහා පරිපාලන හා මූල්‍ය පිරිවැය	-	1,320,617.87
ගෞරව දීමනා ආපසු ගෙවීම්	-	40,000.00
ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය	10,000.00	84,000.00
	274,787.00	**2,171,942.06**

15.6 වත්කම් බැහැර කිරීමෙන් ලද අතිරික්ත මුදල්

වත්කම් සඳහා පිරිවැය - 2019	2,019,859.83
ක්ෂයවීම්	2,014,184.83
විකුණුම් ආදායම්	60,310.00
බැහැරකිරීම් වලින් ලද මුළු ලාභය	54,635.00

16 පුද්ගල පඩිනඩි (වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ)		
වැටුප් හා වේතන	58,418,465.35	48,685,853.87
ගැළපුම් දීමනාව	-	194,253.97
ජීවන වියදම් දීමනාව	8,184,191.94	7,675,823.83
සේවක අර්ථසාධක අරමුදල	8,638,768.66	6,784,962.38
සේවක භාරකාර අරමුදල	2,015,699.62	1,700,506.99
සභාපතිවරයාගේ දීමනා	225,000.00	450,000.00
අනියම් දීමනා/ අභ්‍යාසලාභීන් සඳහා දීමනා	1,578,309.06	1,047,184.27
අතිකාල දීමනා	2,913,251.12	3,665,811.99
සති අන්ත ගෙවීම්	7,523,809.48	11,014,501.91
වෘත්තීය දීමනා	3,164,076.70	*2,714,799.99*
ප්‍රසාද/ ඇඟයීම් දීමනා	1,260,000.00	1,493,750.00
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් දීමනා	29,740.00	39,633.00
සති අන්ත පාසල් කාර්ය මණ්ඩල දීමනා	197,250.00	408,000.00
දුරකථන දීමනා	336,193.06	345,900.00
ප්‍රවාහන දීමනා	5,150,000.00	4,800,000.00
සම්බන්ධීකරණ ගාස්තු	872,889.10	404,507.65
පරීක්ෂා කිරීමේ රසායනාගාර කාර්ය මණ්ඩල දීමනා	473,625.00	486,000.00
පාරිතෝෂික	8,584,374.00	7,833,855.00
සභාපතිවරයාගේ රියදුරු සඳහා දීමනා	17,874.85	24,507.76
උපදේශන දිරිදීමනා/ දඩ සහ අධිභාර	16,015.43	729,903.00
	109,599,533.37	**100,499,755.61**

17 ගමන් ගාස්තු		
දේශීය	547,900.00	1,037,300.00
	547,900.00	**1,037,300.00**

18 සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ			
ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	**18.1**	2,665,372.91	2,662,255.60
වෙනත් පාරිභෝගික භාණ්ඩ	**18.2**	972,886.68	1,614,418.72
ප්‍රතිකර්ම සහ සහතිකකිරීමේ ගාස්තු		1,065,781.91	3,218,430.37
වාහන සහ විදුලි උත්පාදක යන්ත්‍ර සඳහා ඉන්ධන		3,496,910.86	3,970,421.25
		8,200,952.4	**11,465,525.94**

18.1 ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා		
වර්ෂය ආරම්භයේ දී තොගය	1,039,644.18	912,160.22
එකතු කළා - වර්ෂය තුළ මිලදිගැනීම්	2,715,914.06	2,789,739.56
	3,755,558.24	3,701,899.78
අඩු කළා - වර්ෂය අවසානයට තොගය	(1,090,185.33)	(1,039,644.18)
	2,665,372.91	**2,662,255.60**

18.2 පාරිභෝගික භාණ්ඩ, තත්ත්ව පාලන , තුල් සහ සායම්		
වර්ෂය ආරම්භයේදී තොගය	1,080,305.84	1,220,249.62
එකතු කළා - වර්ෂය තුළ මිලදිගැනීම්	1,373,279.73	1,474,474.94
	2,453,585.57	2,694,724.56
අඩු කළා - වර්ෂය අවසානයේ දී තොගය	(1,480,698.89)	(1,080,305.84)

			2020	2019
19	**අඵත්වැඩියාකිරීම් සහ නඩත්තු**			
	ඉඩම් සහ ගොඩනැගිලි		992,866.38	1,641,475.07
	මෝටර් වහන		1,964,416.56	1,900,159.58
	ගෘහභාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ		390,695.60	694,203.44
	රසායනාගාර උපකරණ		6,376,723.78	39,330.00
	පිරියත සහ යන්ත්‍ර	**(19.1)**	704,353.76	716,473.08
	පරිගණක		550,381.70	482,087.33
	කාර්මික මහන මැෂින්		14,283.00	-
	විදුලි උත්පාදක යන්ත්‍ර		287,331.75	66,996.15
			11,281,052.53	**5,540,724.65**
19.1	**අඵත්වැඩියාකිරීම් සහ නඩත්තු**			
	වර්ෂය ආරම්භයේදී අමතර කොටස් තොගය		-	196,857.30
	වර්ෂයේදී මිලදී ගත් අමතර කොටස්		-	112,900.00
	අඵත්වැඩියාකිරීම් සහ නඩත්තු		704,353.76	603,573.08
			704,353.76	913,330.38
	අඩුකළා - වර්ෂය අවසානයේ දී තොගය			(196,857.30)
	යන්ත්‍ර නඩත්තුවට මාරු කළා		**704,353.76**	**716,473.08**
20	**ගිවිසුම් සේවා**			
	රක්ෂණය		200,090.77	170,907.53
	ආරක්ෂණ ගාස්තු		1,793,415.00	1,594,989.34
	පිරිසිදුකිරීම් සේවා		3,415,456.23	3,958,804.04
	විදුලිය		6,113,632.17	7,776,043.91
	ජලය		456,877.13	860,156.99
	සන්නිවේදන සේවා		743,299.58	782,767.57
	තැපැල් ගාස්තු		92,950.00	269,835.00
	වෙළඳ දැන්වීම් සඳහා වියදම්		924,564.40	813,561.11
	ප්‍රවාහන ගාස්තු		1,876,665.75	3,814,697.52
			15,616,951.03	**20,041,763.01**
21	**ක්ෂයවීම්**			
	ගොඩනැගිලි		2,350,593.41	2,029,553.43
	පරිගණක		2,508,077.00	2,821,429.65
	ගෘහභාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ		5,671,547.77	4,904,217.21
	මෝටර් වාහන		2,056,824.11	2,052,857.86
	පිරියත සහ යන්ත්‍ර		3,094,578.75	2,531,240.04
	කාර්මික යන්ත්‍ර		1,630,417.73	1,366,897.73
	රසායනාගාර උපකරණ		7,946,583.80	8,210,104.99
	ග්‍රන්ථ සහ වාරසඟරා		378,412.48	275,419.88
			25,637,035.05	**24,191,720.79**
22	**වෙනත් වියදම්**			
	බාහිර දේශක ගාස්තු		1,400,879.35	2,276,385.77
	විගණන ගාස්තු - වර්ෂය සඳහා වෙන්කිරීම්		1,000,000.00	1,000,000.00
	පුහුණු පාඨමාලා වියදම්		2,051,620.34	6,537,042.45
	විවිධ වියදම්	**22.1**	**231,752.73**	**561,957.89**
	මානව ශක්‍යතා සංවර්ධනය - විදේශීය		-	2,202,889.16
	කාර්ය මණ්ඩල සුබසාධනය - තේ පැන් සඳහා වියදම්		1,125,395.55	1,336,361.16
	කාර්ය මණ්ඩල වෛද්‍ය යෝජනා ක්‍රම		1,749,907.46	1,958,384.20
	සුබසාධන සංගමය		200,000.00	200,000.00
	පාලක මණ්ඩල ගාස්තු		206,000.00	366,800.00
	ප්‍රදර්ශන ගාස්තු		40,390.00	73,314.00
	මුද්දර බදු		28,850.00	37,300.00
	වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන		90,034.85	260,166.52
	අඩමාණ ණයනිම්මියෝ		716,705.23	251,961.05
	NVQ ප්‍රතිනත වියදම්		487,642.00	293,188.00
	ගෝස් පරීක්ෂාකිරීම් සඳහා වියදම්		151,000.00	309,600.00
	සාමාජික දායක මුදල්		129,364.72	124,490.85
	පාසල් නිලඇදුම් රෙදි පරීක්ෂාකිරීම් සඳහා වියදම්		21,176.16	19,075.51
	රැඳවුම් බදු		-	728,895.20
	ජාතිය ගොඩනැගීමේ බදු - වියදම් 2%		-	8,589.00
	තාක්ෂණික ඇගයීම් කමිටු සහ MTB සාමාජිකයින් සඳහා දීමනා		86,000.00	183,000.00
	විගණන සහ කළමනාකරණ කමිටු, අධ්‍යයන සහා සාමාජිකයන් සඳහා දීමනා		72,000.00	77,018.40
	සංග්‍රහ වියදම්		193,387.37	255,801.83
	සහනිකපත් ප්‍රදානෝත්සවය		-	73,364.00
	මන්නාරම මධ්‍යස්ථානයේ වියදම්	**22.2**	-	47,055.00

උපාධි ප්‍රදාන තත්ත්වය ලබාගැනීම සඳහා වියදම්		80,000.00	2,573,945.00
ආර්ථික සේවා ගාස්තු		-	767,617.00
ප්‍රකාශන සහ සභරා		213,705.00	432,624.90
කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල		488,285.00	677,918.00
දොරමඩලාව ශිෂ්‍ය උත්සවය		69,000.00	-
සෞඛ්‍ය සහ ආරක්ෂණ ව්‍යාපෘතිය		443,511.37	-
පාසල් නිලඇඳුම් පරීක්ෂාව		1,302,576.19	-
සුළු සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය වියදම්		12,000.00	-
බැහැරකිරීමෙන් ලද අලාභය	**22.3**	4,004.02	-
කොවිඩ් වසංගතය සඳහා වියදම්		276,101.00	-
		12,871,288.34	**23,634,744.89**

22.1 විවිධ වියදම්

පුවත්පත් බිල්පත්	24,840.00	40,680.00
ශ්‍රමික ගාස්තු	6,000.00	3,200.00
රියදුරු බලපත්‍ර අලුත්කිරීම	-	3,000.00
කසල ඉවත්කිරීමේ ගාස්තු	-	26,973.90
ගරු දීමනා	21,000.00	57,000.00
පරිවර්තන ගාස්තු - වාර්ෂික වාර්තාව සහ වෙනත්	4,007.00	62,712.25
වාහන නැවැත්වීමේ ගාස්තු (ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය)	910.00	290.00
ශිෂ්‍යයන් සඳහා ඖෂධ/ වෛද්‍ය ප්‍රතිකාර	9,292.73	23,316.96
පොත් සහ වාර්තා බැඳීම	5,990.00	300.00
පිරිත් දේශනය	50,338.00	64,118.71
වෙසක් සැරසිලි සහ සිංහල අලුත් අවුරුදු දායක මුදල්	-	140,123.50
රෙදිසේදුම් ගාස්තු	-	1,181.27
වෙනත් වියදම්	4,300.00	500.00
නවඅවුරුදු සුබපැතුම්	-	54,000.00
ඇඟළුම් ආයතනය - වාර්ෂික මහාසභා රැස්වීම	-	10,000.00
උඩකබාය	18,750.00	12,000.00
තක්සේරු ගාස්තු	540.00	10,000.00
මෙස දින දර්ශනය	-	432.00
පරීක්ෂා කිරීමේ ගාස්තු - ජල සාම්පල	-	4,936.23
උපාධි සහතික තහවුරු කිරීම	-	2,500.00
කාර්ය මණ්ඩලය සඳහා හැඳුනුම්පත්	100.00	600.00
DTAC ගෙවීම්	8,320.00	17,500.00
සභරා සඳහා දායක මුදල්	20,694.72	21,908.07
ආරම්භක උත්සවය	1,450.00	-
මෙවලම් සහ සුළු ද්‍රව්‍ය	7,711.64	-
ගිනි නිවීම පිළිබඳ ආදර්ශනය	23,500.00	-
වාර්තා සඳහා ගාස්තු	6,000.00	-
ආරාධිත දේශක ගාස්තු	3,120.00	-
භාණ්ඩ යැවීමේ ගාස්තු	7,648.64	-
බිම් කුළිය	3,240.00	
විවිධ	4,000.00	-
	231,752.73	**557,272.89**

22.2 මන්නාරම් මධ්‍යස්ථානය සඳහා වියදම්

වියදම්		
අතිකාල දීමනා, ගමන් ගාස්තු, සති අග දීමනා		37,250.00
භෞතික සත්‍යාපන වියදම්		9,805.00
ආයතනය විසින් දරන ලද වියදම්	-	**47,055.00**

22.3 වත්කම් බැහැරකිරීම් මඟින් ලද අලාභය

වත්කම් සඳහා පිරිවැය - 2020	1,913,724.49	
ක්ෂයවීම්	1,821,160.03	
විකුණුම් ආදායම්	88,560.44	
බැහැරකිරීම් වලින් ලද මුළු අලාභය	(4,004.02)	


23 මූල්‍ය පිරිවැය


විදේශ විනිමය අලාභය	-	285.74
බැංකු ගාස්තු	75,148.10	181,715.12
	75,148.10	**182,000.86**


24 විලම්බිත ආදායම


රජයේ ප්‍රදාන වශයෙන් ලද ක්ෂය වූ වත්කම් ප්‍රමාණය	23,110,220.99	21,830,794.82
මානව ධාරිතා සංවර්ධනය සඳහා රජයේ දායකත්වය	-	1,184,930.81
	23,110,220.99	**23,015,725.63**

කාර්යසාධන දර්ශක


සේවකයෙකුගේ ආදායම
රු.මී.
2,000
1,500
1,000
500
-
1,505
1951
1614
1926
1622
2016
2017
2018
2019
2020
වර්ෂය
සේවකයෙකුගේ ආදායම



පුනරාවර්තන වියදම්
153
168
177
187
184
100%
80%
60%
40%
20%
0%
2016
2017
2018
2019
2020
වර්ෂය
පුනරාවර්තන වියදම්


පුනරාවර්තන වියදම ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස
(ක්ෂයවීම් හැර)
%
150
100
50
0
129
139
116
113
103
2016
2017
2018
2019
2020
වර්ෂය
පුනරාවර්තන වියදම ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස (ක්ෂයවීම් හැර)


පුනරාවර්තන වියදම් සඳහා මූල්‍යයනය
රු.මී.
250
200
150
100
50
0
170
203
177
183
162
2016
2017
2018
2019
2020
වර්ෂය
පුනරාවර්තන වියදම් සඳහා මූල්‍යයනය


මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව

ආදායම



සමාලෝචිත වර්ෂයේ දී ආයතනයේ මුළු වාර්ෂික ආදායම රු.මි.162 ක් වශයෙන් වාර්තා වූ අතර එය 2019 වසරට සාපේක්ෂව 11% ක අඩු වීමකි. සමාලෝචිත වර්ෂය තුළ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පුහුණු පාඨමාලා පැවැත්වීමට නොහැකිවීම හේතුවෙන් මුළු ආදායම රු.මි. 20.74 කින් අඩු විය. මෙම වර්ෂයට තුන්වන කාර්තුවේ අවසානය දක්වා පාසල් නිලඇඳුම් පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදී.

මෙහෙයුම් ආදායම





පරීක්ෂා කිරීම්, පුහුණු කිරීම් සහ උපදේශන සේවා මගින් උපයන ලද ආදායම සමස්ත මෙහෙයුම් ආදායමෙන් 70% ක් වන අතර මෙහෙයුම් ආදායමෙන් 13% ක් සඳහා පොලී ආදායම (ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ ඇමතුම් තැන්පතු පොලී), ප්‍රවාහන ආදායම සහ විවිධ ක්‍රියාකාරම් ආදී මූලාශ්‍රවලින් දායකත්වය සපයනු ලැබේ. තාක්ෂණික සේවා ආදායම මුළු ආදායමෙන් 17% කි. නමුත්

මෙම වසරේ මුළු ආදායමට දායක වන ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ පරීක්ෂා කිරීම් වේ. එය මුළු ආදායමෙන් 43% ක දායකත්වයක් පෙන්නුම් කරයි. එය හමුදා නිල ඇඳුම්, පාසල් නිල ඇඳුම් සහ අනෙකුත් සාමාන්‍ය පරීක්ෂා කිරීම් වලින් සමන්විත වේ. පූර්ව වර්ෂයට සාපේක්ෂව පුහුණු ආදායම 50% කින් අඩු විය. සියලුම පුහුණු පන්ති 2020 වර්ෂයේ මාර්තු මස අවසානයේ සිට තාවකාලිකව අත්හිටුවන ලද අතර මෙම වර්ෂය සඳහා නව පාඨමාලා ආරම්භ නොවුණි.

පරීක්ෂා කිරීමෙන් ලද ආදායම


සමාලෝචිත වර්ෂය තුළදී පරීක්ෂණ මගින් සාම්පල 4,953 කින් පරීක්ෂා කිරීම් 51,988 ක් සිදු කර රු.මි. 67.5 ක ආදායමක් උපයන ලදී. පූර්ව වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී පරීක්ෂණ ආදායමෙහි 43% ක වර්ධනයක් සිදුව තිබේ.





පුහුණු කිරීම සහ උපදේශනය

ආයතනය මඟින් සපයනු ලබන අනෙක් සේවාව පුහුණුව වේ. 2020 වර්ෂයේ දී ආයතනය විසින් අභ්‍යාසලාභීන් 1,261 කට පුහුණුව ලබා දී ඇති අතර පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 57 කි. තවද 2019 වර්ෂයේ උපයන ලද රු.මි. 87.25 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පුහුණු මඟින් උපයන ලද ආදායම රු.මි. 43.65 කි. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙය 2019 වර්ෂය සමඟ සැසඳීමේදී 50% ක සැලකිය යුතු අඩුවීමකි.



වෙනත් මූලාශ්‍ර මඟින් ලද ආදායම

වෙනත් ආදායම් මූලාශ්‍ර ප්‍රධාන වශයෙන් ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ ඇමතුම් තැන්පතු ආයෝජන ආදායම, ආපදා ණය පොළි ආදායම, ආපනශාලා කුළිය ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු සහ විදේශීය මූල්‍ය ලැබීම් ආදියෙන් සමන්විත වන අතර විභාග සඳහා නැවත පෙනීසිටීමේ ගාස්තු, ප්‍රවාහන ගාස්තු සහ ටෙන්ඩර් ලේඛන ගාස්තු සහ ඡායා පිටපත් ගාස්තු ආදී විවිධ ක්‍රියාකාරකම් මඟින් ඉතිරි ආදායම් සඳහා දායකත්වය දක්වා තිබේ.

වියදම

	2020 රු.මි.	2019 රු.මි.
මෙහෙයුම් ආදායම	162.175	182.92
අඩුකළා: මුළු මෙහෙයුම් වියදම	183.829	186.59
මෙහෙයුම් ලාභය/ අලාභය	(21.65)	(3.67)
විලම්බිත ආදායම	*23.11*	*23.01*
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය)	1.46	19.34

පූර්ව වර්ෂයේ පුනරාවර්තන වියදම වූ රු.මි. 186.59 ට සාපේක්ෂව වර්ෂය තුළ දරන ලද මුළු පුනරාවර්තන වියදම් රු. මිලියන 183.829 ක් වන අතර එමඟින් වියදම්වල 1.5% ක සුළු අඩුවීමක් පෙන්නුම් කරයි. පුනරාවර්තන වියදම් ප්‍රධාන වශයෙන් පුද්ගල වැටුප්, සැපයුම් සහ පරිභෝජන වියදම් වලින් සමන්විත වේ. වසර ආරම්භයේ සිට මාස 3කට වඩා වැඩි කාලයක් ආයතනය සම්පූර්ණ ධාරිතාවයෙන් පවත්වාගෙන යාමට නොහැකි විය. වසංගත කාලසීමාව තුළ නඩත්තු කටයුතු සහ වැටුප් සංශෝධනය හේතුවෙන් මෙහෙයුම් වියදම් ඉහළ ගියේය.

සමස්ත මූල්‍ය ව්‍යුහය

යටිතල පහසුකම්, පිරියත, සහ උපකරණ රු.මි. 160.3 ක ශුද්ධ අගයක් ගනියි. වර්ෂය තුළ මුළු ආයෝජනය රු.මි. 19.5 කි.

- සමස්ත ආයතනික පිරිවැය රු.මි. 183 සිට රු.මි. 162 දක්වා 11% කින් අඩු විය.
- මුළු වියදම රු.මි. 186 සිට රු.මි. 183.82 දක්වා 1.5% කින් අඩු විය.
- මුළු මෙහෙයුම් අලාභය රු.මි. 3.6 සිට රු.මි. 21.6 දක්වා වැඩි විය.

අංශය	ආදායම	ආදායම	වියදම්								
	සංශෝධිත අයවැය 2020 රු.	සත්‍ය රු.	ගිවිසුම් සේවා රු.	පුද්ගල පඩිනඩි රු.	ගමන් වියදම් රු.	සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ රු.	අළුත්වැඩියා සහ නඩත්තු ස්ථාවර වත්කම් රු.	වෙනත් වියදම් රු.	ක්ෂය වියදම් රු.	මුළු වියදම් රු.	අතිරික්තය / (හිඟය) රු.
තත්ත්ව පාලන රසායනාගාරය	55,000,000.00	69,120,711.41	4,086,953.95	19,456,198.26	-	3,244,025.42	7,305,169.24	1,527,009.83	9,930,336.74	45,549,693.44	23,571,017.97
ඇගලුම් තාක්ෂණය	22,570,000.00	15,076,703.00	2,006,350.51	14,935,486.68	175,500.00	887,313.14	770,868.45	673,607.89	2,708,055.41	22,157,182.08	(7,080,479.08)
රෙදිපිළි තාක්ෂණය	25,642,000.00	38,339,957.48	3,507,865.43	17,201,889.20	94,500.00	785,865.10	484,705.74	2,782,386.81	2,013,755.73	26,870,968.01	11,468,989.47
නිෂ්පාදන සංවර්ධනය සහ සැලසුම් නිර්මාණය	15,670,000.00	9,818,551.95	1,846,219.63	7,702,994.90	25,000.00	449,827.53	599,143.08	1,182,750.17	1,987,948.25	13,793,883.56	(3,975,331.61)
ඉංජිනේරු තාක්ෂණය	8,510,000.00	4,261,484.45	929,110.08	8,677,742.27	20,500.00	545,273.98	619,949.63	1,193,140.14	2,637,551.01	14,623,267.11	(10,361,782.66)
පාවහන්	2,300,000.00	3,761,691.66	672,005.48	3,414,342.35	60,500.00	403,890.59	510,621.65	1,308,487.15	2,444,483.85	8,814,331.07	(5,052,639.41)
පරිපාලන සහ ගිණුම්	20,646,000.00	21,795,948.01	2,568,445.95	38,210,879.71	171,900.00	1,884,756.60	990,594.74	4,279,054.45	3,914,904.06	52,020,535.51	(30,224,587.50)
මුළු සංඛ්‍යාව	150,338,000.00	162,175,047.96	15,616,951.03	109,599,533.37	547,900.00	8,200,952.36	11,281,052.53	12,946,436.44	25,637,035.05	183,829,860.78	(21,654,812.82)
විලම්බිත ආදායම්											23,110,220.99
වර්ෂය සඳහා මුළු අතිරික්තය / (හිඟය)											1,455,408.17

2020 වර්ෂයේ ක්‍රියාකාරකම්

විශේෂ අවස්ථා

පාවහන් නිෂ්පාදන පුහුණු පාඨමාලාව සඳහා සහතික ප්‍රදානෝත්සවය - මන්නාරම





සම්මන්ත්‍රණ ශාලාව නවීකරණය කිරීම - සමාරම්භක උත්සවය





අපනයනය සඳහා බතික් සායම්කරණ පාඨමාලාව සඳහා සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය





කාන්තාවන් සඳහා මහන මැෂින් යාන්ත්‍රික පුහුණුව - මාස් හෝල්ඩිංස්





12 වැනි පාවහන් සහ සම් භාණ්ඩ සල්පිල 2020





කොවිඩ් 19 සඳහා පුද්ගල ආරක්ෂණ උපකරණ ප්‍රදානය කිරීම





වාස්තු විද්‍යාඥ සරත් ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ භාර ගැනීම





පොල්පිතිගම පැවැත්වුණු පාවහන් නිෂ්පාදන පුහුණු වැඩසටහන





ISO තත්ත්ව සහතිකය ලබාගැනීමේ නිල උත්සවය





මැහුම්කරුවන්ගේ සංගමය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන





ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා ගින්නෙන් ආරක්ෂාවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන





ළමා ඇඳුම් සඳහා සෞඛ්‍ය ආරක්ෂණ සහතිකපත්‍රය ප්‍රදානය කිරීම





B.Sc විලාසිතා නිර්මාණ සමාරම්භක උත්සවය





දොරමඬල





රාජ්‍ය කඨින මහෝත්සවය සහ පඬු පෙවීමේ මහා මංගල්‍යය SLITA ආයතනයේ දායකත්වය ද සහිතව සිදු කරන ලදි.





බතික් පුහුණු මධ්‍යස්ථානය විවෘත කිරීමේ අවස්ථාව - ගල්ගමුව





2021 වර්ෂය සඳහා ඉදිරි සැලසුම්

- ඩිජිටල් ක්‍රමයක් පදනම් කරගෙන සේවා සැපයීම සහ අධ්‍යයන කටයුතු සිදුකිරීම.
- සිසුන් 200 කට වැඩි ප්‍රමාණකට පන්ති කාමර පහසුකම් සැලසීම සඳහා පන්ති කාමර අළුත්වැඩියා කිරීම.
- තෝරා ගත් පාඨමාලා සඳහා NVQ 4/5 තත්ත්වය ලබාගැනීම.
- රෙදිපිළි නිපදවීම සඳහා කෙසෙල් කෙඳි භාවිතා කිරීමේ ව්‍යාපෘතිය.
- පේෂකර්ම සහ ඇඟලුම් නිෂ්පාදන සම්බන්ධයෙන් සෞඛ්‍ය සහ ආරක්ෂණ ක්‍රියාමාර්ග හඳුන්වාදීම.
- ආයතනය සඳහා උපාධි ප්‍රදාන තත්ත්වය ලබාගැනීම.
- අධ්‍යයන, පර්යේෂණ සහ ව්‍යාපාරික කටයුතු සඳහා අනෙකුත් ආයතන සමඟ සහයෝගීත්ව ප්‍රයත්න දැරීම.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.
ටීඒඕසී/ඒ/එස්එල්අයිටීඒ/20/එෆ්එස්/22

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2022 ජනවාරි 06 දින

SRI LANKA INSTITUTE OF TEXTILE & APPAREL
12 JAN 2022
RECEIVED

සභාපති,

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය.

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ස්ථාවර තැන්පත් ආයෝජනය (call deposit) මඟින් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළී ආදායම රු.9,195,787 ක් වුවත්, එය රු.7,341,295 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් වර්ෂයේ පොළී ආදායම රු.1,854,492 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි 09 වගන්තිය ප්‍රකාරව ආයෝජනයන් මුදල් හා සමාන දෑ ලෙස හඳුනාගැනීමට සුදුසුකම් ලබන්නේ එම ආයෝජන මාස 03 ක කෙටි පරිනත කාලයක් ඇති විටදී වුවත්, වර්ෂයක කාලයක් සඳහා ආයෝජනය කර තිබූ රු.4,777,943 ක් මුදල් හා සමාන දෑ ලෙස හඳුනාගෙන තිබුණි. තවද , එම ප්‍රමිතයේ 40 වගන්තිය ප්‍රකාරව ලද ආයෝජන පොළී රු.22,159,341 ක්, මුදල් ප්‍රවාහයක් ලෙස වෙනම හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ආයතනයට අයත් ඉඩම්වල නාමික වටිනාකම ලෙස රු. 5,018,434 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ නමුත් ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 42 වගන්තිය ප්‍රකාරව එම ඉඩම් ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 07 අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු.204,839,496 ක් වූ දේපළ පිරියත සහ උපකරණ දැනටමත් භාවිතයට ගනිමින් පැවතියද ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය නොතිබුණි. එසේම ශ්‍රී ලං.රා.අ.ගි.ප්‍ර 03 ප්‍රකාරව මෙකී වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව ඇස්තමේන්තුගත දෝෂය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු,

අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම් වූ මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම් එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිගමනය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 ඡේදයේ (ඈ) යටතේ දක්වා ඇති කරුණු හැර ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ)	2009 අංක 12 දරන ජේෂ්ඨකර්ම හා ඇඟලුම් ආයතන පනතේ 16 වගන්තිය	එක් එක් මුදල් වර්ෂය අවසානයේ ආයතනය විසින් එම වර්ෂය තුළ එහි ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් ප්‍රකාශයට පත් කළ යුතු අතර, අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පසු පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. කෙසේ වුවද ආයතනය 2019 වර්ෂය සම්බන්ධයෙන් එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.
(ආ)	1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2000 ජනවාරි 11 දිනැති අංක පිඑෆ්/පිරී 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	(i) ආයතනය විසින් සේවකයන්ට ගෙවනු ලබන සියලුම දීමනා සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබා ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ එකතුව රු. 1,555,032 ක් වූ රසායනාගාර පරීක්ෂණ කාර්ය මණ්ඩල දීමනා, සති අන්ත පාඨමාලා සඳහා කාර්ය මණ්ඩල දීමනා, උපදේශන දීමනා, පාඨමාලා සම්බන්ධීකරණ ගාස්තු

		වැනි දීමනා සඳහා එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.
		(ii) සේවක වෛද්‍ය රක්ෂණයක් සඳහා වාර්ෂික වාරිකය රු. 360,562 ක්ද , වෛද්‍ය බිල් ප්‍රතිපූර්ණය සඳහා රු.1,276,211 ක්ද මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව වර්ෂය තුළ වැය කර තිබුණි.
(ඇ)	2015 මැයි 25 දිනැති අංක PED/2/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය	උපරිම සීමාවට යටත්ව සන්නිවේදන ගාස්තු ප්‍රතිපූර්ණය කර ගත හැකි වුවද, ආයතනය විසින් බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවට උපරිම දීමනා වැටුපට එකතු කර ගෙවීම් කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී වැඩිපුර ගෙවන ලද රු. 346,800 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රතිපූර්ණය කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ද දෙසැම්බර් මස දක්වා එම ක්‍රමවේදයම අනුගමනය කර තිබුණි.
(ඇ)	2018 ජනවාරි 24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය	පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් පිළියෙල කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් කරුණු හැර ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2009 අංක 12 දරන පේෂකර්ම හා ඇඟලුම් ආයතන පනතේ 5 (ඇ) වගන්තිය අනුව දේශීය හා විදේශීය විශ්ව විද්‍යාල සහ ආයතන සමඟ සම්බන්ධතා පවත්වමින් පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රවලට අදාළව උපාධි, පශ්චාත් උපාධි ප්‍රදානය කිරීමේ කටයුතු කළ යුතු වුවත් ඉන්දියානු පෞද්ගලික විශ්ව විද්‍යාලයක් සමඟ පමණක් එම කටයුතු ආරම්භ කර තිබුණි.

(ආ) 2009 අංක 12 දරන පේෂකර්ම හා ඇඟලුම් ආයතන පනතේ 4 (එ) වගන්තිය අනුව නිෂ්පාදනය, ආනයනය ,අපනයනය සහ වෙනත් තාක්ෂණික තොරතුරු ඇතුළත් පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තය පිළිබඳ දත්ත මූලාශ්‍රයක් පවත්වා ගෙන යා යුතු වුවත්, එසේ කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මකවන Healthy and Safety ව්‍යාපෘතියෙන් ඇඟලුම්වල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට රු. 2,237,112 ක් වටිනා යන්ත්‍රයක් මිලදීගෙන තිබුණත් යන්ත්‍රය භාවිතා කර අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවය පිළිබඳව සහතිකයක් ලබාදීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී අනුමත කර ගෙන නොතිබුණි.

2.3 **වෙනත් කරුණු**

(අ) 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත අනුව ආයතන පිහිටුවීමේ පරමාර්ථ 10 ක් දක්වා ඇති අතර, එම පරමාර්ථ ඉටු වන පරිදි ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවත් , ඒ තුළ පාඨමාලා පැවැත්වීම පමණක් ඇතුළත් කර තිබුණි.

(ආ) උක්ත පනතේ 12 වගන්තියට අනුව, කාර්ය මණ්ඩලයේ නිපුණත්වය හා දැනුම වර්ධනය කිරීමේ කාර්යය සඳහා ආයතනය විසින් කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදලක් පිහිටුවා ගත හැකි අතර, අදාළ වර්ෂයේ ආයතනය වෙත ලැබුණු ආදායමින්, නිශ්චය කරනු ලබන ප්‍රතිශතයක් වාර්ෂිකව එම අරමුදලට බැර කළ හැකි වුවද, 2020 වර්ෂයට අදාළව ණයගැති ලැබීම් මත සියයට 0.5 ක ප්‍රතිශතයක් මාණ්ඩලික අනුමැතියකින් තොරව අරමුදලට බැර කර තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී ලද කැබිනට් අනුමැතියක් අනුව මහල් 04 ක නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලංසු කැඳවීමට පෙර සිදු කළ යුතු වූ විවිධ කටයුතු සඳහා රු.3,762,600.00 ක වියදමක් දරා තිබුණි. එහෙත් , ප්‍රතිපාදන සපයා ගැනීමේ අපහසුතා නිසා එම ඉදිකිරීම නැවැත්වීමට තීරණය වීම හේතුවෙන් දරන ලද සම්පූර්ණ වියදම ඵලදායී වී නොතිබුණි.

(ඈ) 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය තුළ වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට ණයගැතියන් 42 දෙනෙකුගෙන් රු.948,156 ක්ද ,වසර 3ත් 5ත් අතර වූ ණයගැතියන් 35 කගෙන් රු. 3,757,350 ක්ද වූ අතර එම ශේෂ අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ එකතුව රු.4,306,291 ක ඇඟලුම් සාම්පල් පරීක්ෂා කිරීමේ (Testing) සේවාවන් කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය වෙත සපයා ඇතත්, 2021 නොවැම්බර් මස වන විට ද එම මුදල අයකර ගෙන නොතිබුණි.

(ඊ) 2015 වර්ෂයේදී පාවිච්චි කරන ලද මෝටර් රථ 05ක් විකුණා ලද රු. 3,871,448 ක මුදල 2018 මාර්තු 19 දිනැති අංක 01 දරන චක්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වුවත් , එම ශේෂය විවිධ ණයහිමියන් යටතේ සමාලෝචිත වර්ෂය තුළ ද දක්වා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති